
අරාබි
නිසොල්ලාසය
THE
ARABIAN
NIGHTS
බී. ආර්. අල්විස්

01. දූපතකට ගිය චාරිකාව.

එකෝමත් එක කාලයක එක් ධනවත් මිනිසෙකු විය. ඒ ධනවත් මිනිසා තම සියලු ධනය සහ දේපල එකම පුතුවන සලීම්ට ඉතිරිකොට මියැදුණේය.

සලීම් ඒ වනවිට පසු වූයේ තරුණ වයසේය. ඒ වයසට නොගැලපෙන පරිදි විශාල ධනස්කන්ධයක් ඔහුට හිමිවීම ඔහු බලාපොරොත්තු වූ දෙයක් නොවීය. ඔහු ඒ මුදල් අලුත් ඇඳුම් පැළඳුම්, සුඛෝපභෝගී කෑම බීම සඳහා මෙන්ම නෘත්‍ය ගීත දැක ඇසීම් ආදිය කෙරෙහි නිර්ලෝභීව විය පැහැදම් කළේය.

ඒ සියල්ල අවසානයේ සලීම් දිලින්දෙකු විය. ඔහුට මුලින් තිබූ හැම සම්පතක්ම අහිමිවිය. අවසානයේදී ඔහු නගරයේ වීදිවල මුට්ට ඔසවන නාටාමියෙකු මෙන් දින ගෙවන්නට විය.

දිනක් ඔහු කාගෙන් හෝ කුලියක් බලාපොරොත්තුව සිටිය දී එක් වයසක මිනිසකු ඔහු කරා ආවේය.

''ඔබට ඔබේ ජීවිතය ඉතා විශිෂ්ඨ තැනකට ගෙනයා හැකියි.'' ඒ මහලු මිනිසා කීය. ''මම මුහුණ දැක්කා. මම ජීවත්වන්නේ තවත් මා වැනිම මහලු මිනිසුන් දහදෙනෙකු සමඟ එකම නිවසක. ඔබ කැමති නම් ඔබ අපේ නිවසේ සේවකයකු සේ එන්න. එසේ වුවහොත් දෙවියන්වහන්සේ ඔබට ඔබේ නැතිවූ දේවල් ආපසු දෙන්නටත් පුළුවන්.''

සලීම් ඒ වයසක මිනිසා සමඟ ඒ මිනිසාගේ නිවසට ගියේය. ඒ නිවස පිහිටා තිබුනේ සලීම් නොදන්නා වූ නගරයේ එක් කොනකය.

සලීම් කැටුව නිවසට ගිය මිනිසා ගෙට ඇතුළුවන්නට පෙර සලීම් ඇමතීය.

''මේ නිවස ගැන ඔබට කිවයුතු වැදගත් කරුණක් තියෙනවා. මෙය ඉතාම අසතුටුදායක තැනක්. ඒත් ඇයි කියලා මගෙන් අහන්න එපා.''

''මම ඒක මතකයේ තියාගන්නම්.'' එසේ කියූ සලීම් වයසක මිනිසා සමඟ නිවසට ඇතුළු විය.

එම නිවස පිටතින් දිස්වූයේ ඉතාම දිළිඳු ආකාරයටය. නමුදු ඇතුළත බෙහෙවින් අලංකාරවත් විය. එහි කාමරවල ඉහළින් සිවිලිම් ගසා තිබූ අතර පාට කළ ගල්වලින් බිම නිමවා තිබිණ. එම නිවසේ මැද මිදුලක් විය. එය අලංකාර උද්‍යානයකින් මෙන්ම චමත්කාරජනක දිය ඇල්ලකින්ද යුක්ත විය. එහි තැනින් තැන රැඳී සිටි කුරුල්ලන් විවිධ රාව නගමින් සිටියහ.

සලීම්ට තවත් ශබ්දයක් ඇසිණ. ඒ අනිකුත් වයසක මිනිසුන් වැලපෙන හඬය. ඒ හඬා වැලපෙන්නවුන් සියල්ලන්ම හැඳ සිටියේ කළු පැහැති ඇඳුම්ය. එමෙන් ම ඔවුහු තම තමන්ගේ කාමරවල යාඥාකරමින් සිටියේ ය.

සලීම් කැටුව එම නිවසට ගිය මිනිසා සලීම්ව තම කාමරයට කැටුව ගියේය. ඔහු එහිදී සලීම්ට රත්තරන් පිරුණු පෙට්ටියක් පෙන්විය.

''ඔබ මේ පෙට්ටිය ඔබේ උවමනාවන් සහ අපේ උවමනාවන් සඳහා ගන්න.'' ඔහු එම පෙට්ටිය සලීම් අතට දෙමින් කීය.

සලීම් එම කාමරයේ දොර තිබෙන ස්ථානය ඉතා උවමනාවෙන් බලා ගත්තේය. එම කාමරය අගුළු පිට අගුළු ලා තිබිණි. නමුදු එහි ඇතුළත ඇත්තේ කුමක්දැයි ඇසීමට සලීම්ට අවසර නොවීය. ඒ මේ නිවස තුළ දී ප්‍රශ්න අසන්න එපා, ඔහු මෙතැනට කැඳවා ගෙන ආ තැනැත්තා විසින් මුලදීම කියා තිබූ බැවිනි.

මේ සියලු දේ අතරමැද වසරක් ගෙවිණි.

සලීම් තම නවක හාම්පුතා හට බෙහෙවින් ලැදිව සේවය කළේය. එම නිවසේ සිටි වයසක මිනිසුන් එකිනෙකා මැරෙන්නට වූහ. අවසානයේදී ඉතිරි වූයේ එක් මිනිසෙකි. ඒ සලීම්ව මෙම නිවසට කැඳවාගෙන ආ පුද්ගලයාය.

ඔහු මිය යාමට ආසන්නයේ දී සලීම් ඔහු අසලට ගියේය. ''ඔබ දැන් ඉන්නේ මරණයට සූදානම්ව..... ඒත් ඔබ මට තාම කිව්වෙ නැහැ ඇයි ඔබ මෙවන් අසතුටකින් ඉන්නේ කියලා'' සලීම් කීය.

''මගේ දරුව...'' ඒ වයසක මිනිසා සලීම්ව ඇමතීය. ''මම මිය යන්නට පෙර ඔබට එක් කරුණක් කියන්නම්. ඔබට සතුටින් ජීවත් වීමට අවශ්‍ය නම් කොයිම මොහොතකවත් වසා ඇති දොර අරින්න එපා.''

එසේ කියා අවසානයේ වයස්ගත පුද්ගලයා මරුමුවට පත්විය. සලීම්ට මැදුර සහ මියගිය අයගේ ධනය හිමිවිය. එනිසා ඔහු ධනවත් පුද්ගලයෙකු බවට පත්විය.

එසේ වුවද සලීම්ගේ සිතට සතුටක් නොවිණ. මහලු මිනිසුන් ගැන මෙන්ම වසා ඇති කාමරය ගැනද ඔහු නිතර නිතර සිතන්නට විය. එම කාමරය තුළ ඇත්තේ මොනවාද? එහි දොර විවෘත කළොත් ඇත්තෙන්ම කාට හෝ කරදරයක් වේද?

එවන් සිතුවිලි මැද තව දුරටත් ඉවසා සිටින්නට සලීම්ට නොහැකි විය. ඔහු බරැති යකඩයක් ගෙන අගුළු ලා ඇති ශක්තිමත් දොරට පහර දුන්නේය. දොර විවෘත විය.

දොර කඩා විවෘත කළ සලීම් බලාපොරොත්තු වූයේ එක් රැස්කර ඇති රත්තරන් තොගයක් දැකගැනීමටය. එහෙත් ඔහුගේ ඒ බලාපොරොත්තුව සුන්විය. කාමරය තුළ තිබුණේ ගන අඳුරක් පමණි. ඒ තුලින් ඇතුළට ඇති

කොරිඩෝවක් යන්තමින් මෙන් සලීම්ට පෙනිණ. ඔහු ලාම්පුවක් ගෙන එය තුළට ඇතුළු විය. ඒ කොරිඩෝව පොළොව යටට උමගක් මෙන් විහිදී ඇත්තකි.

එය දිගේ ඉදිරියට ගිය සලීම්ට සෑහෙන වෙලාවකට පසු හිරු එළියක් දැකගත හැකිවිය. එතැන උමග යේ කෙළවර විය. ඔහු ඉදිරියේ වූයේ රමණීය මුහුදු වෙරළකි.

මුහුදු වෙරළෙහි සිටගෙන කළයුත්තේ කුමක්දැයි සලීම්ට සිතාගත නොහැකි විය. වටපිට බලන ඔහුට අහසෙහි යම් කිසි අමුතු දෙයක් දක්නට ලැබිණි.

ඈත අහසේ සිට තමා වෙත පාවී ආ විශාල වළාකුලක් යැයි සලීම් සිතුව ද ඒ වළාකුලක් නොව යෝධ පක්ෂියකු බව ඔහුට වැටහෙද්දී ඒ කුරුල්ලා ඔහු අසලටම ළඟාවී හමාරය.

සැණෙකින් ඒ යෝධ කුරුල්ලා බිමට පහත්වී උගේ පාදවල තියුණු නියපොතුවලින්, සලීම්ගේ ඇඳුම්වලින් අල්ලාගෙන යළි ඉහළ අහසට නැගිණි.

දඬු අඬුවකට අසුව සිර වුණාක් වැනි වූ සලීම්ට කර කියා ගත හැකි කිසිවක් නොවීය. යෝධ කුරුල්ලා ඔහුත් ඔසවා ගෙන මුහුද හරහා අහසෙහි ඉහළින් ඈතට පියාසර කරන්නට විය.

ඒ පියාසර කිරීම එක් රැයක් පුරාම සිදුවිය. පසුවදා එළිය වැටෙද්දී සලීම් වටපිට බැලීය. යෝධ කුරුල්ලා ඔහුත් ඔසවා ගෙන දූපතකට පැමිණ තිබිණි.

යෝධ කුරුල්ලා කෙමෙන් කෙමෙන් බිමට පහත්වන්නට විය. මිනිසුන් රැසක් කුරුල්ලා රැගෙන එන දෙය දෙස බලා සිටින අයුරු සලීම්ට පෙනිණ.

බිමට පහත් වූ කුරුල්ලා ඒ මිනිසුන් පිරිස මැද සලීම්ව තබා යළි අහසට ඉගිලිණි.

මිනිසුන් පිරිස සලීම්ව වටකර ගත්තේය. එක්

අයෙකු සලීම්ගේ හිස මත ඔටුන්නක් පැළැන්දුවේය. අන් අය ඔහුව කදිම අශ්වයකු පිට නංවාලීය. ඒ සමඟම අසුපිට නැගී ඔහු ඉදිරියෙන් සහ පසුපසින් සොල්දාදුවෝ පෙළ ගැසිණ.

අනතුරුව සලීම්ව පිරිවරා ගත් එම පිරිස අලංකාර උද්‍යානයක් මැද පිහිටි රමණීය මාලිගාවක් කරා ඔහු කැටුව ගියහ. ඉන්පසු ඔහුට ඇතුළුවීමට සිදුවූයේ එම මාළිගාව තුළ පිහිටි ශාලාවකටය. එහි පසෙකින් මැණික් ඔබ්බවා සාදා තිබූ ආසන දෙකක් විය. ඒ එක් අසුනක සලීම් මෙතෙක් කිසිදු දිනක දැක නැති අන්දමේ සුරූපි කාන්තාවක් වූවාය.

සලීම් එම ශාලාවට ඇතුළුවෙත්ම රූමත් කාන්තාව අසුනින් නැගිට්ටාය.

''මමයි මේ දූපතේ රැජිණ.... ඔබ පැමිණෙන තුරු මම බොහෝ කාලයක් බලා සිටියා. ඔබේ පැමිණීම මට හරිම සතුටක්.'' ඇය කීවාය.

ඇය ඔහුව අතකින් අල්ලාගෙන ඔහු කැටුව මාළිගාව පුරා සහ උද්‍යානයේ හැම තැනකම ඇවිද්දාය.

''මේ සේරම ඔබගේ....'' ඇය ආදරණීය බැල්මක් හෙලමින් පැවසුවාය.

තමාව විවාහ කරගෙන තමා රජකමට පත්කිරීමට ඇයට අවශ්‍යව ඇතැයි සලීම්ට සිතිණ.

''මම කැමතියි මේවට..'' සලීම් තම එකඟත්වය පලකළේය.

''ඒත් එක් දෙයක් තිබෙනවා ඔබට අයිති නැති'' එසේ කී ඇය යළිත් ඔහු පළමු කාමරය කරා කැටුව ගියාය. එහි මුල්ලක වූ දොරක් ඔහුට පෙන්වූවාය. පැමිණි මුල් අවස්ථාවේ ඔහු නොදුටු මෙම දොර වසා අගුළු ලා තිබිණි.

''මේ දොර නම් කොහෙත්ම අරින්න එපා. එය ඇරියොත් ඔබට ඔබේ මුළු ජීවිත කාලයම දුක්බරව ගතකරන්නට වේවි.'' ඇය කීවාය.

ඔහු එයට එකඟ විය.

සලීම් රැජිණ විවාහකර ගත්තේය.

වසර කීපයක් ගත වන තුරුම ඔවුන් ප්‍රීතිදායක ජීවිතයක් ගත කළහ. මුල් කාලය තුළ මාලිගාව තුළ වසා ඇති දොර ගැන සලීම් එතරම් දුරදිගට සිතුවේ නැත. එහෙත් ටිකෙන් ටික ඒ ගැන ඔහුගේ සිත තුළ කුතුහලයක් ඇතිවෙන්නට විය. එය දිනෙන් දින වැඩි වෙත්ම සලීම්ගේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් ගතවුණේ ඒ ගැන සිතන්නටය.

''මට අර වයසක මිනිස්සුත් කිව්වා එයාලගෙ ගෙදර වසා ඇති දොර විවෘත කරන්නට එපා කියලා. ඒත් මම ඒ දේ කළා. ඒ නිසයි මට මේ දූපත වගේම මගෙ බිසවත් ලැබුණෙ. ඉතින් මේ මාලිගාවේ තියෙන දොර විවෘත කළොත් මට මොනවා ලැබේවිද?'' සලීම් නිතරම එසේ සිතන්නට විය.

එක් දිනක් මේ වසා ඇති දොර විවෘත කිරීමේ කුතුහලය ඔහු තුළ ඇති විය. බිසවද ලඟ පාතක නොවීය. ඔහු එම දොර වෙත පා නැගීය. එහි අගුළු නොතිබිණ. ඔහු පහසුවෙන් දොර විවෘත කළේය.

කාමරය තුළ වූයේ දැඩි අඳුරකි. ඔහු මදක් ඇතුළට ගියේය. ඒ අඳුර තුළින් දිලිසෙන ඇස් දෙකක් ඔහුට දක්නට ලැබිණ. තව ටිකක් උනන්දුවෙන් බලද්දී හිසක් පෙනිණ. ඊළඟට ඔහුට පෙනුණේ අත්තටු ඇති විශාල සිරුරකි. ඒ තමාව මෙම දූපතට ගෙනා කුරුල්ලා බව සලීම්ට සැනෙකින් මතක් විය.

සැනෙකින් ඒ යෝධ කුරුල්ලා අඳුරු කාමරයෙන්

පිටව ශාලාවට පැමිණියේය. සලීම සැඟවෙන්නට උත්සාහ දැරීය. එහෙත් එය කළ නොහැක්කක් විය.

සලීම්ව අල්ලාගත් කුරුල්ලා මාලිගාවෙන් පිටතට ඉගිල ආවේය. ඊළඟට අහසට නැගුණු කුරුල්ලා ඈතට ඉගිලෙන්නට විය. සලීම් තම මාලිගය, උයන දෙස දුක්බරව බැලීය. මොහොතකින් ඒවා කුඩාවී කුඩාවී නොපෙනී යන්නට විය. කුරුල්ලා සලීම්ව ඔසවාගෙන තව තවත් ඉහළට සහ ඈතට ඉගිලුණේය. මුහුද හරහා ඉගිලුණේය. සලීම්ට තම දූපත පවා නොපෙනී යන්නට විය.

දිනක් හා රාත්‍රියක් පුරා කුරුල්ලා සලීම්ව ඔසවාගෙන ඉගිලෙන්නට ඇත. දුක සහ විඩාව නිසා නින්ද ගිය සලීම් ඇස් ඇර බැලුවේ ඔහුගේ දෙපා මහ පොළව මත ගැටුණු විටය.

සලීම්ව එසේ බිම තැබූ කුරුල්ලා, අහසට නැගී යළි ඈතින් ඈතට ඉගිල ගියේය.

සලීම් වටපිට බැලීය. යෝධ කුරුල්ලා ඔහුව ගෙනවිත් අත්හැර ගොස් තිබුණේ මුහුදු වෙරළකටය. මේ මුහුදු වෙරළ සලීම්ට මතකය. කලකට ඉහතදී යෝධ කුරුල්ලා විසින් සලීම්ව ඔසවා ගෙන ගියෙත් මෙතැන සිටය.

මාස කීපයක් ගතවන තුරුම සලීම් මුහුදු වෙරළ දිගේ ඒ මේ අත ඇවිද්දේය. ඒ කුරුල්ලා පැමිණ යළිත් තමාව දූපතට ගෙනයාවි යන බලාපොරොත්තුවෙනි. එහෙත් එය සිදු නොවිණ.

තමාව ඒ රමණීය දූපතට ගෙන ගොස් හැරලිය හැකිදැයි ඔහු ධීවරයන්ගෙන් විමසීය. එහෙත් එවන් දූපතක් ගැන ඒ කිසිවකු දැන සිටියේ නැත. අවසානයේ දී ආපසු දූපතට යෑමට කොයි ලෙසකින්වත් මගක් නැති බව සලීම්ට අවබෝධ විය.

තමාට තම බිසව පමණක් නොව හැම දෙයක්ම අහිමි වී ඇති බව ඔහුට වැටහිණ. ඒ සමඟම ඔහුට මතක් වූයේ තමා සිටි නිවසේ රැඳී නිතරම දුක්බරව හුන් මහලු මිනිසුන් ගැනය. තමා මෙන්ම වසා ඇති දොරවල් විවරකරන්නට ගොස් ඔවුන් ද අවසානයේ දුකට පත්වන්නට ඇතැයි සලීම්ට සිතිණි.

දැන් සලීම් ද එවැන්නෙකි.

ඔහු ආපසු නගරයට ගියේය. මහලු මිනිසුන් සිටි නිවස එසේම තිබිණ. ඔහු එහි පදිංචි විය.

ඔහු දිනපතාම තම අහිමි වූ යස ඉසුරු, සතුට සොම්නස මෙනෙහි කරමින් වැලපුණේය. ඒවා යළි ලැබෙන්නයි යාඥා කළේය. එහෙත් යළි කිසිදු දිනක ඔහුට හිනැහෙන්නට ලැබුණේ නැත.

ඔහු බොහෝ දුක සේ කාලය ගත කළේ ය.

02. අපූරු දඬුවම හා තෑග්ග

හෙරොන් කාලිෆ්වරයා බලවත් පුද්ගලයෙකි. නමුදු ඔහු රැය පහන් කළේ නිදි වර්ජිතවය. ඔහු සමඟ අගමැතිවරයා ද තනි නොතනියට කාලිෆ් මන්දිරයට වී කල් ගෙවීය.

අගමැතිවරයා සමඟ සිටි එක් රාත්‍රියක කාලිෆ්වරයා හිටිගමන් වැලපෙන්නට පටන් ගත්තේය.

''මේ රාත්‍රියත් හරිම දිගයි. නිදි නැතුව ගෙවන මේ රාත්‍රියයන් එවන් දිගු බවක් නොදැනෙන පරිදි ගෙවා ගන්නට මා කළ යුත්තේ කුමක්ද?'' කාලිෆ්වරයා අගමැති සමඟ විස්සෝපයෙන් කීය.

ඒ අවස්ථාවේ එතැන තවත් අයෙකු හුන්නේය. ඔහු දැවැන්ත සිරුරකින් හෙබි කළු වහලෙකි. දිවා රැයේ

කාලිෆ්වරයාගේ රැකවලෙහි යෙදෙන ඔහු හිටි හැටියේ සිනහවෙන්නට විය.

ඒ විකාර දුටු කාලිෆ්ට සිනහ පහළ නොවීය. ඒ වෙනුවට ඔහුගේ සිතට නැගුණේ කෝපයකි.

''නුඹේ හාම්පුතාට නින්ද නොයන එක නුඹට විහිළුවක් වුණාද?... වයසට යන්නට යන්නට නුඹේ සිහිකල්පනාව වෙනස් වෙලාද..?''

කාලිෆ්වරයා පහ නොවූ කේන්තියෙන් යුතුව කෑගැසීය.

''මගේ ස්වාමීනි..''; කළුවහලා බැගෑපත්ව කාලිෆ්ව ඇමතීය. ''සත්‍ය වශයෙන් මම ඔබ තුමාට සිනහ නොවුණෙමි. ඊයේ මම දුටු දෙයක් ගැන සිහිපත්වී මට ඉබේටම සිනහ පහළ වුණා. ඊයේ මම ටයි ග්‍රිස් ගඟේ පහළ පැත්තට ගියා. මම දැක්කා උස මහත මිනිහෙක් වට කර ගෙන මිනිස්සු පිරිලා ඉන්නවා. ඒ උස මහත මිනිහා විවධ දේ කියමින් සහ කරමින් අර වටේ හුන් මිනිස්සුන්ව සිනහ ගැන්නුවා. ඔහු මාවත් හිනා ගැස්සුවා. ඒ දේවල් මතක් වෙලයි මට ඉබේටම සිනහ පහල වුණේ.''

හෙරොන් කාලිෆ්ට නින්ද ළඟා නොවී තව ටික වෙලාවක් ගතවිණ. කෙසේ හෝ කාන්සියකින් තොරව ඉක්මනින්ම රැය පහන් කර ගැනීමට ඔහුට අවශ්‍ය විය. ඔහු තම කළුවහලාට කථා කළේය. ''ඔබ ගිහින් ඒ මිනිසාව කැඳවාගෙන එන්න. ඒ මිනිසා නුඹ සිනහ ගැන්නුවා වාගේ මාත් සිනහ ගන්නාවි දැයි බලමු.''

මස්රෝර් ඒ මොහොතේම තරබාරු මිනිසා වෙසෙන ගෙය සොයාගෙන ගියේය.

ඒ මිනිසාගේ නම අබ්දූර්රසාක් ය. මස්රෝර් කතා කළ සැනින් නැගිට ඒමට අබ්දූර්රසාක් මැළිවිය.

කාලිෆ්වරයා විසින් ඔහුව කැඳවා ගෙන ඒමට තමාට අණ කළ බව මස්රෝර් කීය.

''හරි.... අපි ඉක්මනට යමු...'' නියෝගය කාලිෆ්වරයාගෙන් බව දැනගත් වහාම අබ්දූර්රසාක් කඩිනමින් හැඳ පැළඳගෙන එලියට බැස්සේය. ''අපි කවදාවත් බලවත් මිනිසුන්ව රස්තියාදු කරන්නට හොඳ නැහැ...;''

කාලිෆ් මැඳුරට යන අතර මගදී මස්රෝර් මොහොතකට අබ්දූර්රසාක්ව නතර කර ගත්තේය.

''දැන් ඔබ ගිහින් කාලිෆ්ව සිනහ ගැන්වුවහොත් ඔහු ඔබට මුදල් දේවි. හැබැයි එකක් මතක තියාගන්න. ඔබ ගැන ඔහුට කිව්වේ කවුරුද කියන එක ගැන... ඒක කලේ මේ මස්රෝර්... ඒ කියන්නේ මම. ඒ හින්දා ඔහු ඔබට දෙන මුදලින් හතරෙන් එකයි ඔබට අයිති. ඉතිරි හතරෙන් තුන මට දෙන්නට ඕන.''

''එහෙම බැහැ.....'' අබ්දුර්රසාක් කීය. ''මම හතරෙන් තුනක් අරගෙන ඔබට හතරෙන් එක පංගුවක් දෙන්නම්....''

මේ වාදය තරමක් වෙලා පැවතිණ. අවසානයේදී ලැබෙන දෙයින් තුනෙන් පංගුවක් අබ්දුර්රසාක්ටද ඉතිරි තුනෙන් දෙපංගුව මස්රෝර්ටද හිමිවිය යුතු බවට දෙදෙනා එකඟතාවයකට පැමිණියහ.

අනතුරුව ඔවුහු මැදුරට ගොස් කාලිෆ්වරයා බැහැදුටහ.

''නුඹ මහ පාරේදී මිනිසුන්ව සිනහ ගැන්වූ බව මට ආරංචි වුණා.'' කාලිෆ්වරයා අබ්දුර්රසාක්ව අමතමින් කීය. ''බලමු නුඹට මේ කාලිෆ්වත් සිනහ ගන්වන්නට පුළුවන්ද කියලා..''

අබ්දුර්රසාක් විවිධ විහිළු කතා කියමින් කෝලම් නාටක ඉදිරිපත් කරන්නට විය. ඒවා අසාබලා සිටියවුන් ගෙන් මස්රෝර් මුලින්ම හිනැහෙන්නට විය. ඊළඟට අගමැතිවරයාට සිනහ පහළ විය. ඒ සමඟම විහිළුකාරයා ද නියත වශයෙන්ම බූරුවෙකු සේ සිනහව අනුකරණය කරමින් හිනැහෙන්නට විය.

එහෙත් කොයිම ලෙසකින්වත් කාලිෆ්වරයාගේ මුවට සිනහවක් නැගුණේ නැත. එපමණක් නොව ඔහුගේ මුහුණේ රැඳී තිබුණේ හැඟීම් විරහිත බවකි. මෙය අබ්දුර්රසාක්ගේ විමතියට කාරණයක් විය.

අවසානයේදී අබ්දුර්රසාක්ගේ විකට රංගන නවතාලන ලෙසට කාලිෆ්වරයා අණ කළේය.

''මට මේ විකාර බැලුවා හොඳටම ඇති. ඒත් මේ බලපු ඒවාට මම ඔබට ගෙවන්නම්.'' කාලිෆ්වරයා කීය.

අනතුරුව කාලිෆ්වරයා මස්රෝර්ව කැඳවීය.

''මස්රෝර්..... මේ මිනිසාට කස පහර නවයක් ගසනු..'' කාලිෆ් අණ කළේය. ඒ අනුව මස්රෝර් කසයක් ගෙන අසතුටින් සිටින අබ්දුර්රසාක්ට පහර දෙන්නට විය.

''එකායි.... දෙකායි.... තුනායි....''

කස පහර තුනක් වදිත්ම අබ්දුර්රසාක් බලයෙන් මෙන් මස්රෝර් ගේ පහරදීම නතර කළේය.

''හරි.... මගේ පංගුව හරි... ඉතිරි හය ඔබටයි මස්රෝර්... කෝ දැන් මගේ වාරය මට කසය දෙන්න...'' අබ්දුර් රසාක් කෑගසමින් කීය.

''ඇයි ඒ මොකද?'' කාලිෆ්වරයා ප්‍රශ්න කළේය.

අබ්දුර්රසාක් තමා සහ මස්රෝර් අතර ඇතිවූ ගිවිසුම කාලිෆ්වරයාට කීය. ඒ ගිවිසුම අනුව තමාට ලැබෙන දෙයින් තුනෙන් පංගුවක් තමාටත් ඉතිරි තුනෙන් දෙපංගුව මස්රෝර්ටත් හිමිවිය යුතු නිසා ඉතිරි කස පහර හයේ උරුමක්කාරයා මස්රෝර් බව අබ්දුර්රසාක් කීය.

''ඔබට ඔබේ තුනෙන් දෙපංගුව ඕනද?'' අනතුරුව කාලිෆ්වරයා මස්රෝර්ගෙන් විමසීය.

''නැහැ.... නැහැ.... මගේ ස්වාමීනි.... මට ඔහුට ලැබෙන දෙයින් තුනෙන් දෙපංගුව එපා. ඔහුට ඔබතුමා දෙන සියල්ලම ඔහුටම ගන්නට කියන්න.'' මස්රෝර් පිළිතුරු දෙමින් කීය.

''හරි... එහෙම නම් ඒ ගිවිසුම අවලංගුයි.... මා දෙන දෙයින් ඉතිරි දෙපංගුවත් අයිති අබ්දුර්රසාක්ටමයි.'' එසේ කියූ කාලිෆ්වරයා ඉතිරි කස පහර හයත් අබ්දුර්රසාක්ටම

ගසන ලෙස මස්රෝර්ට අණ කළේය.

ඒ අණ මස්රෝර් විසින් ඒ අන්දමින් පිළිපැද්දේය.

කස පහර කා දුක්මුසුව සිටින අබ්දුර්රසාක්ට කාලිෆ් මැදුරෙන් හැකි ඉක්මනින් පිටව යාමට අවශ්‍ය විය. එහෙත් කාලිෆ්වරයා එයට ඉඩ නොදුන්නේය.

''ඔය තරම් හදිස්සි වෙන්න එපා. ඔය කස පහර නවය ඔබට මා ගෙවන ගෙවීමේ එක් කොටසක් විතරයි..'' කාලිෆ්වරයා කීය.

මේ ඇසූ අබ්දුර්රසාක්ගේ මුහුණ සුදුමැලිවී ඔහු භීතියෙන් මුසපත් විය. ඒ කාලිෆ්වරයාගේ මීලඟ දඬුවම කුමක්දැයි ඔහුට සිතාගැනීමටවත් නොහැකි වූ නිසාය.

''ඊළඟට ඔබට කරන දෙවැනි ගෙවීම..... එය කළ යුත්තේ මගේ අගමැතිවරයා විසිනුයි. ඔහු ඔබට මගේ මුදල් වලින් රත්තරන් ඩිනාර් අනූවක් දෙයි.'' එසේ කියන ගමන්ම කාලිෆ්වරයා මස්රෝර්ගේ අසතුටින් පිරි මුහුණ දෙස බැලීය.

ඒ සමඟම කාලිෆ්වරයාට සිනහ පහළ විය. ඒ මෙම රැය පුරා ඔහුට නැගුණු ප්‍රථම සිනහවය.

03. මෝඩ කරණවෑමියාගේ කතාව.

බැග්ඩෑඩ් නුවර ෆයිසාල් නම් ධනවත් තරුණයකු සිටියේ ය. ඔහුට විශාල නිවසක් තිබිණ. මෙහෙකරුවන් ද සෑහෙන පිරිසක් ඔහු වෙත සිටියේ ය.

මෙතරම් ධනවත් තරුණයකු වුව ද ඔහු කිසිදු දිනයක විවාහයක් ගැන නොසිතීය. ඔහු නිතරම සිතුවේ ආදරය, විවාහය යන දේවල් මෝඩකම් බවය.

එක් දිනක් ඔහු නගරයේ මාවතක ඇවිද යනවිට තමා ඉදිරියට සිනාමුසු මුහුණින් පැමිණෙන කාන්තාවන්

පිරිසක් ඔහුට පෙනිණ. එවන් ගැහැනුන් මුලිච්චි වීමට ඔහුට උවමනාවක් නොවීය. ඔහු සැණෙකින් පාර අයිනට වී ඒ ගැහැනුන් පිටමං වනතුරු ඉවත බලා හුන්නේය.

ඒ ඉවතට යොමුකළ ඔහුගේ දෑසට අසල මන්දිරයක ජනේලයේ අසලින් මැත්වූ රුවක් පෙණුන. ඒ රුව තරුණියක ගේය.

මල්පැල කිහිපයකට වතුර දැමූ ඇයගේ දෑස ඔහු වෙත එල්ලවිය. ඔහුද ඇය දෙස බලා හුන්නේය. මොහොතකට ඒ සිවු දෑස් එකිනෙක පැටලිණ.

සැණෙකින් ඇය ජනේලය අසලින් ඉවත්ව නොපෙනී ගියාය.

ඒ මොහොතේ පටන් ෆයිසාල්ගේ ජීවන රටාව වෙනස් විය. ලොව සිටින රූමත්ම යුවතිය තමා දුටුවේයැයි ඔහුට සිතිණ. සිහි එළවා ගත නොහැකිව මෙන් යළි ඒ රුව දකින තුරු ඔහු මොහොතක් හුන් තැනම හුන්නේය. එහෙත් ඒ රුව යළි නොපෙනිණ.

ටික වේලාවකින් සේවකයන් පිරිසක් පිරිවරාගත් අයෙකු පිට නැගී මිනිසෙකු මාවත ඔස්සේ එන අයුරු ෆයිසාල්ට දක්නට ලැබිණ. ඒ පැමිණි තැනැත්තා අර තරුණිය සිටි ගෙයට ඇතුළු විය.

''ඒ අර යුවතියගේ පියා විය හැකියි.'' ෆයිසාල් තමාටම කියා ගත්තේය.

අනතුරුව ඔහු තම නිවස බලා ගියේය.

ඔහු තම යහන මත වැතිරුණේය. ඔහුට නින්දක් නොවීය. කෑමට බීමට රුචියක් ද නොවීය. ඔහුව සතුටු කරන්නට සේවකයන් උත්සාහකල ද එය අසාර්ථක විය.

මේ අන්දමට කළකිරීමෙන් සිටින ෆයිසාල් කරා එක් මහලු කාන්තාවක් පැමිණියාය. ඇය ඉඳහිට ආහාර වැනි යමක් ඉල්ලා ගැනීමට ෆයිසාල්ගේ නිවසට පැමිණෙන කාන්තාවකි. තමාට කාරුණිකව සංග්‍රහ කරන ෆයිසාල් දුක්මුසුව යහනක වැතිර සිටිනු දුටු ඒ මහලු කාන්තාව ඔහු හමුවට පැමිණියාය. අනතුරුව යමක් තේරුම් ගත් බවක් පෙන්වා හිස මදක් සෙලවූවා ය.

''හිතේ උපන් ආදරයක් නිසයි ඔබ මේ අන්දමින් සිටින්නේ.... හොඳ පුතා වගේ මට ඇත්ත කියන්න.

කවුරුන් ද ඔබේ හදවත සොරාගත් යුවතිය..?'' ඇය ඉතා ලෙන්ගතුව ෆයිසාල්ගෙන් විමසුවාය.

ඇය සමග තම සිතෙහි ඇති වූ හදිසි වෙනස කිවයුතු යැයි ෆයිසාල්ට සිතිණ. ඔහු තමා අහම්බෙන් දුටු යුවතිය ගැන මෙන්ම ඇයගේ නිවහන ගැන ද මහලු කාන්තාව සමඟ කීවේය.

''අපෝ මගෙ පුතේ....'' මහලු කාන්තාව දෑස් උඩ රන්දාගෙන කීවාය. ''ඒ ගැහැනු ළමයා ප්‍රධාන විනිශ්චයකාරතුමාගේ දුව. ඔහු ඔබ කෙතරම් තරුණ ධනවත් අයෙකු වූවත්, ඔබට ඔහුගේ දියණිය විවාහකර දේවියැයි කියලා සිතන්න බැහැ.''

ඇය එසේ කියත්ම ෆයිසාල්ගේ මුහුණ හොඳටම අඳුරු විය. මහලු කාන්තාව ඔහුව සනසවමින් තව දුරටත් කතා කරන්නට වූවාය.

''ඒත් ඔබ බලාපොරොත්තු නැති කරගන්න එපා. මම ඔවුන්ගේ නිවස දන්නවා. මම එහෙට ගිහින් ඒ තරුණ ගැහැනු ළමයා සමඟ කතාකරන්නම් ඔබ ගැන...''

එසේ කියූ මහලු කාන්තාව තම පොරොන්දුව ඉටුකරන රිසියෙන් ප්‍රධාන විනිශ්චයකාරතුමාගේ නිවසට ගියාය. ඇය එහි ඇතුළු වූයේ හඬා වැලපෙමිනි.

''වයසක අම්මේ ඇයි ඔබ හඬන්නේ...? මොකක්ද ඔබට ඇතිවෙලා තියෙන ප්‍රශ්නය...?'' විනිශ්චයකාරවරයාගේ තරුණ දියණිය තම නිවසට පැමිණි මහලු කාන්තා වගේ රත් පැහැ ගැන්වී ඇති දෑස් දෙස බලමින් විමසුවාය. ''කියන්න ඇයි ඔබ මේ තරම් දුක්බරව ඉන්නේ....?

''අයියෝ..'' මහලු කාන්තාව හැඬුම් ස්වරයෙන් පිලිතුරු දෙන්නට වූවාය. ''මම වැලපෙන්නේ නිස්කාරනේ මැරෙන්නට යන අසරණ තරුණයෙක් වෙනුවෙනුයි....''

''කවුද ඔහු ...? ඇයි ඔහු මැරෙන්නට යන්නේ...? '' තරුණිය ඇසුවාය.

මහලු කාන්තාව තරුණිය සමඟ ෆයිසාල් ගැන කියන්නට වූවාය. ඔහුගේ වත්පොහොසත්කම, ඔහුගේ රූප සෝභාව, ඔහුගේ පවුලේ තත්වය ඇය අතිශයෝක්තියෙන් වර්ණනා කරමින් කීවාය. ඇයට අවශ්‍ය වූයේ කෙසේ හෝ ෆයිසාල් සමඟ විවාහවීමට මෙම තරුණිය කැමති කරවා ගැනීමටය.

තරුණිය සිටියේ ද පියාගේ පාලනයෙන් මිදීයාමේ අවශ්‍යතාවය ඇතිවය. එමෙන්ම ඇය විවාහයට සූදානම් විය යුතු වයසේ පසු වූවාය. එනිසාම ඇයට මෙම තරුණයා දැකීමේ රුචියක් ඇතිවිය.

''මේ සිකුරාදා උදේ මගේ පියා යාඥාකිරීම සඳහා යනවා. ඒ වෙලාවට ඒ තරුණයාට එන්නට කියන්න... එවිට මට ඔහු සමඟ කතාකිරීමට පුළුවන්...''

ඒ තොරතුරු රැගත් මහලු කාන්තාව ෆයිසාල් හමුවට ගියාය. ඒ ආරංචිය ෆයිසාල්ට ඉමහත් බලාපොරොත්තු ඇතිකරන්නක් විය.

සිකුරාදා එළිය වැටෙත්ම ෆයිසාල් හොඳින් දිය නා ගත්තේය. ඊළඟට ඔහුට රැවුල කොණ්ඩය කපාගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා කරණවෑමියෙකු කැඳවාගෙන ඒම සඳහා ඔහු තම සේවකයෙකු නගරය බලා පිටත් කළේය.

කරණවෑමියෙකු සොයා නගරයට ගිය මෙහෙකරුට තරමක් ප්‍රමාදවන්නට සිදුවිය. ඒ ඉක්මනින් කරණවෑමියෙකු සොයාගත නොහැකි වූ නිසාය. අවසානයේ දී ඔහුට කරණවෑමියෙකු හමුවිය. ඒ කරණවෑමියා කැටුව සේවකයා ෆයිසාල්ගේ නිවස වෙත ආවේය.

තරුණිය හමුවීමට මහළු කාන්තාව විසින් ලබාදුන් කාලය ඉකුත් වන්නට පෙර ලක ලැස්තිව යාමට ෆයිසාල්ට අවශ්‍ය විය. එහෙත් කරණවෑමියාට එවන් හදිසියක් නොවීය.

කරණවෑමියා කයිවාරුකාරයෙකු විය. ඔහු ෆයිසාල්ගේ කෙස් හා රැවුල කපන අතර විවිධ දේ කියවන්නට විය. ඔහු එතරම් සතුටුදායක හෝ සිනහග න්වන සුළු හෝ නොවන කතාවක් කීය. ඒ අතර හිසකේ ස්වල්පයක් කැපීය.

කරණවෑමියා තම සොහොයුරාගේ, බිරිඳගේ, පියාගේ අසනීප ගැන කීය. ඒ අතර කෙස් ස්වල්පයක් කැපීය.

තමා කොතරම් හොඳ කරණවෑමියෙක් දැයි ඔහුම තමාව වර්ණනා කරගන්නට විය. එහෙත් ඔහු හැරදා වෙනත් තැන් සොයා ගිය මිනිසුන් කීපදෙනෙකු ගැන ද ඔහු කීය.

ඒ කතා ඇසීමෙන් ෆයිසාල් හොඳටම වෙහෙසට පත්විය. ඒ එවන් කතා නොව ඉක්මන් සේවයක් ඔහු කරණවෑමියාගෙන් අපේක්ෂා කළ හෙයිනි.

''ඉක්මන් කරන්න... මට යාළුවෝ කට්ටියක් දකින්නට යන්නට තියෙනවා.'' ෆයිසාල් නොඉවසිල්ලෙන් කීය.

''යාළුවෝ...'' බාබර් උස් හඬින් කීය. ''දැන් තමා මටත් මතක් වුණේ. මමත් යාළුවෝ වගයකට මා එක්ක කෑමට ආරාධනා කළා. ඒත් මම තාම ඔවුන් සඳහා ආහාර ගත්තේ නැහැ. ඔවුන් මා ගැන කුමක් සිතාවිද...?

''මේ අහන්න.... මට දැන් පිටතට යන්නට ඕන. මගේ නිවස තුළ සූදානම්ව ඇති ආහාර දැන් මට අවශ්‍ය නැහැ. ඒ සේරම ඔබ ගන්න. ඒ එක්කම ඔබ ඔබේ වැඩය ඉක්මනින් කරලා පිටත්ව යන්න.'' ෆයිසාල් කීය.

''මහත්මයාණෙනි.....; මම ඔබට කෙසේ ස්තුති කරන්න ද... ඔබ මට කරන මේ උදව්ව. මම මොනවා ද ඔබ වෙනුවෙන් කරන්නට ඕන...? හරි කමක් නැහැ. ඔබ වෙනුවෙන් මා ඔබ සමඟ එන්නම් ඔබේ මිතුරා ගේ නිවසට...''

ඒ කියමන ෆයිසාල්ගේ කෝපය වර්ධනය කරන්නක් විය.

''ඔබ ඔබේ මිතුරන් වෙත යන්න. මම මගේ ගමන යන්නම්. මම යන තැනක කවුරුත් එක්ක යන්නට මට ඕනෑ නැහැ....'' ෆයිසාල් කීය.

''අපෝ....'' කරණවැමියා ෆයිසාල් වෙත ඇඟිල්ලක් දිගුකර සෙලවීය.

''මට හිතෙනවා ඔබ යන්නේ ගැහැනු ළමයෙක් දකින්නට කියලා. ඒ හින්දයි ඔබට තනියම යන්නට ඕන. හොඳයි මම හරිද?.... මම හිතන විදිහ හරිනම් ඔබ මාත් එක්ක යන්න. මේ වගේ වැඩවල දී මම මගේ හුගක් යාළුවන්ට උදව් කරලා තියෙනවා.''

කරණවැමියා මෙසේ උනන්දුවෙන් මෙන් දොඩවද්දී එය තම සේවකයින්ට ඇසෙතැයි ෆයිසාල් කලබල විය.

''යන්න ඔබ ගිහින් ඔබේ මිතුරන්ට අවශ්‍ය කෑම ලෑස්ති කරන්න. ඒක කරලා ඔබ එනතුරු මම ඉන්නම්. ඊට පස්සේ අපි දෙන්නාම මගේ මිතුරා බලන්න යමු.'' ෆයිසාල් එසේ කීවේ මේ කයිවාරුකාර කරණවැමියා ගෙන් මිදෙන අදහසිනි.

ඔහුගේ උපායට කරණවැමියා හසුවිය. වාචාල දොඩවමින් තම කාර්ය කළ කරණවැමියා පිටත්ව ගියේය.

ඒ වන විටත් ෆයිසාල්ට තමාට වෙන්වූ නියමිත කාලය ඉක්ම යමින් පැවතිණි. ඔහු හැකි ඉක්මනින් තරුණියගේ නිවස බලා පිටත්විය. ඒ වන විටත් පල්ලියේ සිකුරාදා උදේ යාඥාව සඳහා සියල්ල සූදානම්ව තිබිණ. ෆයිසාල් හා ගිවිසගත් පරිදි මහලු කාන්තාව ඔහු එන පෙර මග බලා හුන්නාය.

ෆයිසාල් තරුණියගේ නිවස වෙත ලඟාවීය. මහලු කාන්තාව එහි විය. ඇය ඔහු කැටුව මැදුර ඇතුළත දැකුම්කළු කාමරයකට ගියාය. ඔහු එහි අසුන් ගැන්වූ මහලු කත තරුණිය කැටුව ඒම සඳහා පිටතට ගියාය.

වාඩිවී සිටි ෆයිසාල්ට හිටි ගමන් යමෙක් කෝපයෙන් කෑ ගසන හඬ ඇසිණ. ඔහු කවුළුවකින් එබී බැලීය. අභාග්‍යයකි ! තරුණියගේ පියාවන ප්‍රධාන විනිශ්චයකාරවරයා යාඥාව ඉවර වී ආපසු පැමිණ ඇත.

ෆයිසාල්ට ඇසුණේ විනිශ්චයකාරවරයා විසින් වරදක් කරනු ලැබූ සේවකයෙකුට පහර දෙන හඬය. විලාප නඟමින් පහර කෑ එම සේවකයා සිහිසුන්ව බිම ඇද වැටුණේය.

සියල්ල මෙසේ සිදුවෙද්දී අපේ කරණවෑමියා ද ඔහුගේ නිවසට යාමට ගිය ද ඔහු ඒ ගමන නොගියේය. ෆයිසාල් පොරොන්දු වුව ද ඔහු තමා කැටුව නොයන බව කරණවෑමියා සිතීය. එනිසාම තමාට අවශ්‍ය ආහාර ගෙන ඒමට කුලියක් ගෙවා මිනිසකු පිටත්කළ ඔහු ෆයිසාල් ගිය මග යන්නට විය.

ෆයිසාල් පසුපස පැමිණි කරණවෑමියා විනිශ්චයකාර වරයාගේ නිවස අසලට ආවේය. එසේ පැමිණි ඔහු නිවසින් පිටත පාර අසල රැඳී හුන්නේය. එසේ සිටින ඔහු විනිශ්චයකාර වරයාගේ පහර කෑ සේවකයා මහ හඬින් කෑගසන හඬ ඇසිණි. කරණවෑමියාට

ක්‍ෂණිකව මතක් වුණේ ෆයිසාල්වය. විනිශ්චයකාර වරයාට ෆයිසාල් අසුවන්නට ඇතැයි කරණවැමියාට සිතිණි. ඔහු විනිශ්චයකාර මැඳුරේ දොරටුවට වේගයෙන් පහර දෙන්නට විය.

''බේරාගන්න..... බේරාගන්නට උදව් කරන්න.... ඔවුන් මගේ හාම්පුතාව මරන්නයි හදන්නේ..... අයියෝ.... ඉක්මනට එන්න..... මගෙ හාම්පුතාව බේරාගන්න....''

මේ කෑගැසීම ඇසුණු සමහරු තම තමන්ගේ නිවෙස්වලින් පිටතට ආහ. ඒ සමඟ යාඥාව අහවරවී පල්ලියෙන් ආ මිනිසුන් ද එතනට රැස්වූහ. මොහොතකින් සියයකට අධික පිරිසක් විනිශ්චයකාරවරයාගේ නිවස ඉදිරිපිට රොක් වූහ. ඔවුන් ද කරණවැමියා අනුකරණය කරමින් කෑ ගසන්නට වූහ.

''උදව් කරන්න.... බේරාගන්නට උදව්කරන්න... මේ තැනැත්තාගේ හාම්පුතාව කවුරුන්දෝ මරණවාලු.... ඔහුව බේරාගන්නට උදව් කරන්න.''

තම මන්දිරය පිටතින් ඇසෙන මේ කෑකෝ ගැසීම විනිශ්චයකාරවරයාටද ඇසිණ. ඔහු තම මැඳුරේ දොර විවෘත කළේය. තම දොරකඩ පිරී සිටින සෙනඟ දුටු විනිශ්චයකාර වරයාට විමතියක් මෙන්ම මද චකිතයක්ද ඇතිවිය.

කරණවැමියා සෙනඟ අතරින් ඉදිරියට විත් විනිශ්චයකාර වරයා ඉදිරියෙහි සිටගත්තේය.

''ඔබ මගේ හාම්පුතාව මොන හිංසාවක්ද කරන්නේ......? ඔහු ඇසීය. ඒ සමඟම රැස්ව සිටි පිරිස ද කෑගසන්නට වූහ.

''ඔබ ඔහුගේ හාම්පුතාට මොන හිංසාවක්ද කරන්නේ.....'' ඔහු නැවතත් ඇසීය.

''කවුද ඔබගේ හාම්පුතා.....?'' විනිශ්චයකාරවරයා විමතියෙන් මෙන් ඇසීය.

''ඒ තැනැත්තා මගේ ගේ ඇතුලේ මොනවාද කරන්නේ....?''

''ඔබ නරක මහලු මිනිසෙක්...'' කරණවෑමියා උස් හඬින් කීය. ''ඔබ හොඳින් දන්නවා මගේ හාම්පුතාව ඔබේ දියණියට ආදරය කරන බව. ඇය දකින්නට ආ අවස්ථාවේ ඔබ ඔහුව මරන්නට නේද හදන්නේ...?''

විනිශ්චයකාරවරයාට මේ කිසිවක් අදහාගත නොහැකි විය. ඔහු රැස්ව සිටින පිරිසව, සාවධානව අමතන්නට උත්සාහ දැරීය.

''යහපත් මිනිසුනි.., මගේ නිවස ඔබලා සියල්ලන්ම සඳහා විවෘතයි. මම සහතික වශයෙන්ම කියනවා මේ පුද්ගලයා පවසන ඔහුගේ හාම්පුතා මගෙ නිවස තුළ නොමැති බව.... ඒත් ඔබලාට සැකනම් ඔබලා විසින්ම මගේ නිවස පරීක්ෂා කර බලන්න.''

කරණවෑමියා අනෙකුත් මිනිසුන් ද කැටුව විනිශ්චයකාර වරයාගේ නිවසට ඇතුළු විය.

ඔවුන් එන හඬ සහ කෑගසන හඬ ෆයිසාල්ට ඇසිණ. ඔහු සැඟවිය හැකි තැනක් සොයමින් අවට බැලීය.

ළඟ පාතක විසල් පෙට්ටියක් තිබිණ. ෆයිසාල් එතුළට රිංගීය. එවිටම කරණවෑමියා එම ස්ථානයට ළඟාවිය.

''මහත්මයාණනි......, මම ඔබව හොඳින් ආරක්ෂා කරනවා...'' කරණවෑමියා එම පෙට්ටිය අසලට වී උස් හඬින් කෑ ගැසීය.

ඒ සමඟම නිවස තුළට ආ පිටස්තර මිනිසුන් එතැනට දිව එන්නට විය. කරණවෑමියා පෙට්ටිය පහත

ආලිංගනයට ඔසවාගෙන යන්නට සූදානම් විය.

''ඔබ මෝඩයෙක් ....'' පෙට්ටිය තුළ සැඟවී සිටින ෆයිසාල් කරණවෑමියාට කීය. ''මම බලාපොරොත්තු වෙනවා වෙනත් කවුරුන් හෝ ඔබෙන් මාව මුදා ගනීවි කියලා.''

එසේ කී ඔහු පෙට්ටියේ එක් පසකට පයින් ගැසීය. කරණවෑමියාට පියවර නැගීම වැරදිණි. සැනෙකින් පෙට්ටිය පඩිපෙළ දිගේ පහතට පෙරළෙන්නට විය.

අවසානයේ දී ෆයිසාල් පෙට්ටිය තුළින් පිටතට ආවේ බරපතල ලෙස තුවාල සහිතවය. ඔහුගේ අතක් බිඳී තිබිණි. ඔහු සෙනඟ අතරින් රිංගා මාවතට පැමිණියේ ය.

අනතුරුව ඔහු තම නිවසට යනවිට කරණවෑමියා ද ඔහු පසු පස ආවේය.

''මගේ හාම්පුතාව බේරාගන්නට මට හැකිවීම ගැන දෙවියන් වහන්සේට ස්තුතිවේවා. ඔහුව බේරා ගන්නට ලැබීම මට කොයිතරම් සතුටක්ද?...'' මෝඩ කරණවෑමියා උද්දාමයට පත්ව පැවසුවා ය.

04. ළමයාගේ අපූරු නඩු තීන්දුව.

එකෝමත් එක කාලෙක බැග්ඩෑඩ් නුවර අලිකෝෆියා නම් මිනිසෙකු විසීය. රස කැවිලි විකුණන්නකු වූ ඔහු එතරම් පොහොසතෙකු නොවීය. ඔහුට බිරිඳක් හෝ නඩත්තු කිරීමට පවුලක් ද නොවිණ. ඔහු හරිහම්බ කරපු දේ ඔහුට සෑහිණ.

තම වෙළඳසැලෙහි පසුපස කාමරයෙහි පොළව යට ලොකු ජෝගුවක් වළලා තබාගත් ඔහු හැම සතියකම තමා උපයාගත් දෙයින් එක් රන්කාසි කැබැල්ලක් එම ජෝගුවට දැමීය.

ඒ මුදල ඔහු එසේ තැන්පත් කළේ තම මහලු වයසේදී හෝ හදිසි අසනීපයක දී ප්‍රයෝජනයට ගනු සඳහාය.

''මම මහලු වුණාම හරි අසනීපයක් වුණාම හරි මාව බලාගන්න මට සාත්තු සප්පායම් කරන්නට හරි පුතෙක් නැති නිසා මේ මුදලවත් මට ඒ වගේ වෙලාවක ප්‍රයෝජනවත් වේවි.'' ඔහු එම ජෝගුවට රන්කාසි දමන හැම විටකම කල්පනා කළේ ය.

තමාට වයස අවුරුදු පණහ පිරුණු පසු දිනක මෙමජෝගුව වලලා තිබූ තැනින් පිටතට ගත් අලි එහිවූ රන් කැබලි ගැන්නේය. එහි රන් කැබලි දහසකට අධික සංඛ්‍යාවක් විය.

''මම වයසට ගිය දවසකට මේ හොඳටම ඇති...'' අලි තමාටම කියා ගත්තේය.

අලි ඇත්තෙන්ම යහපත් මිනිසෙකි. ඔහු හැම සිකුරාදාකම පල්ලියට ගියේය. දුප්පතුන්ට මිල මුදලින් උපකාර කළේය. එහෙත් ඔහුට එක් වැදගත් දෙයක් ඉටුකරන්නට නොහැකි විය. එනම් මක්කමට වන්දනාවේ යෑමය.

ඔහු මෙම වන්දනා ගමන ගැන දිගින් දිගටම සිතන්නට විය. ඔහුට මුදල් ඇත. මුදල් නැති අය ද මක්කම වන්දනාවේ යති.

අලි සිතන විදිහට බැග්ඩෑග් නුවර වාසය කිරීම පහසුය. නමුදු මක්කම වන්දනාවේ යාම දුෂ්කර ගමනකි. නමුදු වන්දනාවේ යෑමට සිතට ආ අදහස දිනෙන් දින මෝරා වැඩුණා මිසක අඩුවී ගියේ නැත.

ඒ අතර මක්කම් වන්දනාවේ යන කාලය ළංවිය. ඒ ගමන යා යුතුම යැයි අලි තීරණය කළේය.

''මේ ගමන මම මක්කම වන්දනාවේ යනවා...''

අලි තම මිතුරන් සියලු දෙනාටම කීය.

ඔහු තම වෙළඳසැල විකුණා ගමනට සූදානම් විය. එහෙත් ඔහුට තවත් එක් ගැටලුවක් ඉතිරිව තිබිණ. ඒ තම රන්කාසි බහාලූ ජෝගුව ගැනය. තමා ගමන ගොස් ආපසු එනතුරු එම ජෝගුව තබා යන්නේ කා ලඟ දැයි අලි අනේක වාරයක් කල්පනා කළේය.

අවසානයේදී ඔහු තීරණයකට එළැඹිණ.

වෙලඳසැලකට ගිය ඔහු ඔලිව් සෑහෙන ප්‍රමාණයක් මිලදී ගත්තේය. ඒවා ගෙන ගිය ඔහු තම රන්කාසි බහාලූ ජෝගුව ගෙන එහි ඇති රන් කාසි වැසීයනතෙක් ඔලිව් පිරවීය. ඉන්පසු ඔහු එය තම හිතවත්ම මිතුරෙකු වන හුසේන් නමැති වෙළෙන්දා වෙත රැගෙන ගියේය. හුසේන්ගේ වෙළඳසැල තිබුණේ අලිගෙ වෙළඳසැලට යාබදවය.

''හුසේන්....., මම දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලබන්නට මක්කමට යනවා. මේ ජෝගුව ඉතිරිවෙන්නට මම මගේ අතිකුත් සියලුම දෑ විකුණුවා.'' එසේ කියමින් අලි තම ජෝගුව හුසේන්ට පෙන්වීය. ''මේ ජෝගුව පුරවලා තියෙන්නෙ ඔලිව්වලින්. නිකම් අපරාදෙ මේ වගේ හොඳ ආහාරයක් විසිකර දමන්නට මම කැමති නැහැ. ඉතින්.... මේ ඔලිව් ජෝගුව මම මක්කම ගිහින් එනතුරු ඔබ ළඟ තබා ගන්න...''

''අපෝ..... ඔබ වැනි මිතුරෙකු වෙනුවෙන් එය ඉතාම සුළු දෙයක්....'' හුසේන් කීය. ''ඔය ජෝගුව මගේ සාප්පුවේ අන්න අර කොනේ තියන්න.... එයට කිසි කෙනෙක් අත තියන්නෙ නැහැ. නැවත බැග්ඩෑඩ් බලා ඒමට ඔබට දේවාශිර්වාද ලැබේවා..!''

තම මිතුරාට ජෝගුව බාර දුන් අලි මක්කම බලා පිටත්විය.

සති කීපයකින් මක්කමට ලඟාවීමට අලිට හැකිවිය. ඔහු එහි දී සියලුම ආගමානුකූල වතාවත් වල යෙදිණ.

ඉන්පසු ඔහුට ආපසු පිටත්වීමට නියමිත කාලය එළැඹිණ. මේ බැග්ඩෑඩ් නුවරින් පිටතට අලි ගිය ප්‍රථම සංචාරය විය. මෙයට සහභාගිවන්නට ප්‍රථම අලිගේ හිතේ මෙවන් සංචාරයන් ගැන යම් චකිතයක් තිබුණ ද මක්කමට පැමිණි මේ ගමනින් පසු ඔහුට එවන් සංචාර ගැන ඇතිවුයේ බලවත් රුචියකි. එනිසාම ආපසු එක්වරම බැග්ඩෑඩ් නුවරට යනවාට වඩා තව දුරටත් සංචාරයක යෙදීමේ ආශාව අලිට ඇතිවිය.

''යමු අපිත් එක්ක කයිතේ නුවරට.....'' මක්කමදී අලිට හමුවූ ඊජිප්තු වෙළෙන්දන් පිරිසක් ඔහුට කීහ. ''එහෙ ඔබ වැනි රස කැවිලි හදන්නෙකුට නිතරම වැඩ තියෙනවා.....''

අලි ඔවුනගේ කීමට එකඟව ඊජිප්තුවට ගියේය. එහි ඔහු වසර දෙකක කාලයක් ගත කළේය.

එයින් පසුව ඔහු පැමිණියේ දමස්කස් නුවරටය. එහිදී ඔහු සෑහෙන කාලයක් දේපල මිලදී ගෙන වෙළඳ කටයුතු කරමින් කල් ගත කළේය. කෙමෙන් කෙමෙන් ඔහු බැග්ඩෑඩ් වලින් නික්ම ඇවිත් වසර හතක කාලයක්ම ගෙවී ගියේය.

''දැන් විදේශ රටවල කල් ගත කළා හොඳටම ඇති..'' අලී දිනක් සිතීය. මෙහෙ තියෙන දේවල් විකුණලා මම ආපහු මගෙ උපන් රටවන බැග්ඩෑඩ් වලට යන්නට ඕනෑ. එහෙ ගිහින් මැරෙන තුරුම මගෙ හිතමිතුරන් සමඟ ඉන්නවා.

එසේ සිතූ ඔහු ඊ ගමනට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කරගෙන දමස්කම් නුවරින් පිටත් විය.

මේ දිනවල බැග්ඩෑඩ් නුවර සිටින අලීගේ මිතුරු

හුසේන්ගේ බිරිඳට ඔලිව් යම් ප්‍රමාණයක් අවශ්‍ය විය. එහෙත් නිවසෙහි ඔලිව් ඉවරවී තිබිණ. එදින කඩ සාප්පු වසා දමන දිනයක් හෙයින් මිලදී ගැනීමට ද තැනක් නොවීය.

''දැන් කොහෙන්ද ඔලිව් සොයා ගන්නේ....'' ඇය තම සැමියා වන හුසේන්ගෙන් ඇසුවාය.

''ඔලිව් වගයක් මගෙ සාප්පුවේ නම් ඇති....'' හුසේන් කීය. ''ඔබට මතකද දැන් අවුරුදු හතකට විතර ඉස්සර අලී මා ළඟ පරිස්සමට තබා ගිය ඔලිව් ජෝග්ගුව...? ඔහු නැවත මක්කමේ ඉදන් මෙහෙ එන්නෙ නැහැ.... දැන් අවුරුදු හතකුත් ගිහිල්ලානෙ.... සමහරු කියනවා ඔහු මක්කම ඉදන් කයිරෝ නුවරට යන්නට ඇති කියලා. ඒත් මට නම් හොඳටම විශ්වාසයි දැනටමත් ඔහු මැරිලා ඇති කියලා..''

''ඔහුත් මැරිලා නම් ඉතින් අපි ඒ ඔලිව් ටික ආපසු ප්‍රයෝජනයට ගනිමු..''

බිරිඳ කළ ඒ යෝජනාවට හුසේන් එකඟ විය.

හුසේන් තම වෙළෙඳ සැල වෙත ගියේය. අලි විසින් තබා ගිය තැනම ඔලිව් ජෝගුව තිබිණි. ගතවූ හත් වසර තුළ කිසිවකු එයට අතවත් තබා තිබුණේ නැත.

හුසේන් ජෝගුවේ මූඩිය ඉවත්කර ඇතුළ බැලීය. උඩින්ම ඇති ඔලිව් හොඳටම වියලි ඇති බව ඔහුට පෙනිණි. ඔහු ජෝගුව තුළට අත දැමීය. ඔහු ඇතුළත වූ දෑ අත්ලට ගුලිකර ගෙන අත පිටතට ගත්තේය.

තෙල් සහ ලුණු තැවරී කළු පැහැගැන් වූ රන් කැබලි රැසක් ඔහුගේ අතට අසුවී තිබිණි.

ඔහු නැවතත් ජෝගුව තුලට අත දමා තවත් රන් කැබලි රැසක් සොයා ගත්තේය. ඔහු යළිත් රන් කැබලි සියල්ලම ආපසු ජෝගුව තුලට දමා ජෝගුව තිබූ

අයුරින්ම වසා තැන්පත් කර නිවස බලා ගියේය.

''ඒ ඔලිව් වැඩක් නැහැ. හොඳටම වේලිලා පරණ වෙලා.....'' හුසේන් තම බිරිඳ සමග කීවේ එපමණයි.

පහුවදා තම වෙළඳ සැලට ගිය ඔහු අන් කාහටත් නොපෙනෙන සේ ජෝගුව තුල තිබූ ඔලිව් සියල්ලම පිටතට ගත්තේය. එයින් ඔලිව් ටික ඉවතට විසිකල ඔහු රන් කැබලි සියල්ල තෝරා බේරාගෙන ඒවා තම ගෙවත්තේ එක් ස්ථානයක සුරක්ෂිත ලෙස වළලා දැමීය.

පසුව වෙළඳ සැලට ගිය ඔහු අලුතින් ඔලිව් මිලදී ගෙන විත් ඒවායින්, මුලින් තිබූ පරිද්දෙන්ම ජෝගුව පිරවීය. අනතුරුව එය මුලින් තිබූ ලෙසම වසා මුලින් තිබූ තැනම තැබීය.

''අවුරුදු හතක් කියන්නේ සැහෙන දීර්ඝ කාලයක්. ඒත් මට හරියටම හිතන්න බැහැ අලි මැරිලාමයි කියලා... හරි කමක් නැහැ මිනිහා වැරදිලාවත් ආපසු ආවොත් මම ඔලිව් පුරවපු ජෝගුව ඔහුට දෙනවා. ඒකෙ ප්‍රශ්නයක් ඇති වෙන්න විදිහක් නැහැනේ. ඔහු මට බලාගන්න දීලා ගියෙත් ඔලිව් පුරවපු ජෝගුවක්නෙ..'' හුසේන් තමාටම කියා ගත්තේය.

මේ සිද්ධියෙන් සති කීපයකට පසු අලි ආපසු බැග්ඩෑඩ් නුවරට පැමිණියේය. පැමිණිමෙන් පසු ඔහුගේ පළමු කාර්යය වුයේ තම මිතුරාවන හුසේන් බැලීමට යාමය. හුසේන් නිවසෙහි සිටියේ ය.

දෙදෙනාම මඳ වේලාවක් විවිධ දේ ගැන කතා කළහ. ඒ කතාබහ නිමවීමෙන් පසු තම ඔලිව් පිරවූ ජෝගුව ගැන අලි හුසේන්ගෙන් ඇසීය.

''ඔලිව්...? මොන ඔලිව්ද....?'' හුසේන් පුදුමයෙන් මෙන් ඇසීය.

''ඔබට මතක ඇති මක්කමට යන්නට ඉස්සරින්

මා ආපසු එනතුරු පරිස්සම් කරන්න කියලා ඔබට දීලා ගිය ඔලිව් පුරවපු ජෝගුව....'' අලී කීය. එය ඔබේ වෙළඳ සැලේ මුල්ලක තිබ්බේ..... දැන් මතකයි නේද?

''ම්... ම්.... සමහර විට ඔබ මට ජෝගුවක් දීලා යන්න ඇති. මට හරියටම මතක නැහැ. අවුරුදු හතක් කියන්නේ හරිම දිගු කාලයක්නෙ..... හරි අපි කෝකටත් මගෙ වෙළඳ සැලට ගිහිල්ලා බලමුකෝ ඒ ජෝගුව එතැන තියෙනවද කියලා..'' හුසේන් පිළිතුරු දුන්නේ ඕනාවට එපාවට මෙනි.

හුසේන් ඒ අන්දමින් පිළිතුරු දීම නිසා අලීගේ සිතෙහි කුතුහලයක් ඇතිවිය. එහෙත් ඒ වගක් නොපෙන්වා හුසේන් සමඟ ඔහුගේ වෙළඳ සැලට ගියේය.

ජෝගුව මුලින්ම තබා ගිය තැනම තිබිණ. අලීගේ සිතෙහි සතුටක් ඇති විය.

''මගේ හොඳ යාළුවා...'' ඔහු හුසේන්ට ඇමතීය. ''ඔබ මේ ජෝගුව අවුරුදු හතක් ප්‍රවේශමෙන් බලා ගත්තා. ඒ සඳහා මම ඔබට යමක් තෑගි කළ යුතුයි. ඔන්න බලන්න ඔබ අවුරුදු හතක් තිස්සේ ආරක්ෂා කළ ජෝගුව තුළ මොනවද තියෙන්නේ කියලා...''

එසේ කියමින් අලි ජෝගුව තුළට අත දැමීය. එහෙත් ඔහු විසින් හුසේන්ට තෑගි කිරීමට සිතූ රන් කැබලි කීපය ඔහුගේ අතට අසු නොවිණ. ඒ වෙනුවට අතට අහුවුණේ ඔලිව් පමණකි. ඔහු යළි යළිත් ජෝගුව තුලට අත දමා බැලීය. එහෙත් එකම රන් කැබැල්ලක් වත් ඔහුට අසු නොවීය.

''දෙවියනේ කෝ මගෙ රත්තරන් ...'' අලී සංවේගයෙන් කෑ ගසා ඇසීය.

''රත්තරන්.... ? මොන රත්තරන් ද.....? ''

''මේ ජෝගුව තුළට මා දැමූ රත්තරන්....''

''ඔබ මට කිව්වේ නැහැ රත්තරන් දැමූ ජෝගුවක් ගැන... ඔබ මට දීලා ගියේ මේ ඔලිව් පුරවපු ජෝගුව විතරයි.''

අලි ඉතා උවමනාවෙන් හුසේන් දෙස බැලීය.

''මගෙ යාළුවේ හුසේන්.. ඔබේ මුදල් අවශ්‍යතාවයකට ඒවා ගත්තා නම් ඒ ගැන කියන්න. බය වෙන්න එපා... සති කීපයක් ඇතුළත ඔබ ඒ මුදල ආපසු දෙන්න. ඒත්.....''

අලීට තවත් යමක් කීමට ඉඩක් නොවිණ. හුසේන් ඔහුට බාධා කරමින් කතා කරන්නට විය.

''මම ඔබේ ජෝගුවට අතවත් තිබ්බේ නැහැ. මම දන්නෙ නැහැ ඔබේ රත්තරන් ගැන...'' හුසේන් උස් හඬින් කීය.

මේ ගැන ඔවුන් දෙදෙනා අතර සෑහෙන වෙලාවක් බහින්බස් වීමක් සිදුවිය.

''හා.. දැන් මේ කතාව ඇති. '' අලි කීය. ''මම යනවා අධිකරණය හමුවට අධිකරණ නායකයා දැන ගනීවි අපි දෙන්නාගෙන් ඇත්ත කිව්වේ කවුද කියලා... ඒ වගේම බොරු කී කෙනාට දඬුවමුත් කරයි....''

ඒ කියූ ලෙසම අලි තම පැමිණිල්ල අධිකරණ නායකයා වෙත ඉදිරිපත් කළේය. ඒ අනුව ඔහු අධිකරණය හමුවට කැඳවිණි.

''ඔබ ජෝගුවට රන් කැබලි දමනවා ඔබ හැරෙන්නට වෙනත් කෙනෙක් දුටුවාද?'' අධිකරණ නායකයා අලිගෙන් ඇසීය.

''නැත ස්වාමීනී.... මම තනියමයි ඒවා දැම්මෙ... මට බිරිඳක් හෝ වෙනත් ඥාතීන් හෝ නැහැ...''

''ඔබ මේ ජෝගුවට එම රන් කාසි දැමූ බව

වෙනත් කා සමඟ හෝ කීවාද?''

''නැත ස්වාමීනී..; '' මේ බවක් වෙනත් කෙනෙකු දැන ගන්නවාට මම කැමති වුණේ නැහැ.''

''ඔබ ජෝගුව තුළ මොනවා තිබෙනවා කියලද හුසේන් ට කිව්වේ.''

''ඔලිව්..''

අලිගෙන් එසේ ප්‍රශ්න කළ අධිකරණ නායකයා ඊළඟට හුසේන් දෙසට හැරුණේය.

''ඔබට කවුරුන් හෝ කීවාද මේ ජෝගුව තුළ තිබෙන්නේ රත්තරන් කියලා...?''

''නැත ස්වාමීනී...;''

''ඔබ කොයි යම් වෙලාවක හරි මේ ජෝගුව විවෘත කලාද?''

''නැත ස්වාමීනී...;''

අධිකරණ නායකයා අලි දෙස බලා ඔහුට ඇමතිය.

''මේ කරුණ ගැන ඔබ අපේ කාලය කෙතරම් නාස්ති කළාද? කිසිම කෙනෙක් දැකලා නැහැ ඔබේ ජෝගුව තුළ රත්තරන් එකම කැබැල්ලක්වත් තිබුණු බව...''

එසේ කියූ අධිකරණ නායකයා අලී වෙත තීක්ෂණ බැල්මක් හෙළීය.

''අලි .... දැන් ඔබ වයසක මනුස්සයෙක්. අවුරුදු හතකට ඉස්සර කළ දේවල් ගැන දැන් ඔබට මතක නැතිව ඇති...''

එසේ කියූ අධිකරණ නායකයා හුසේන් නිදොස් කර නිදහස් කළේය.

අලී කෝපයෙන් පිපිරෙමින් ගෙදර ගියේය.

තමාට අධිකරණයෙන් සිදුවූ මේ අසාධාරණය ගැන පැමිණිලි කළ හැකි තව එක් තැනක් ගැන අලිට

මතක් විය. ඒ කාලිෆ්වරයා වෙතය.

අලි තමාට සිදුවූ අසාධාරණය ගැන සියලු විස්තර ඇතුළත් කොට ලිපියක් ලියා කාලිෆ් මැදුරේ සේවකයකු අත කාලිෆ්වරයා වෙත යැවීය.

මේ වන විට මෙම ඔලිව් ජෝගුවේ කතාව මුළු බැග්ඩෑඩ් නුවර පුරාම පැතිර යන්නට විය. හැම දෙනාම පාහේ මේ ගැන විවිධ දේ කතා කළහ.

සමහරු අලිගේ ප්‍රකාශ විශ්වාස කළ අතර තවත් සමහරු හුසේන්ගේ කතාව විශ්වාස කළහ.

මේ අතර කාලිෆ්වරයාට අලිගේ ලිපිය ලැබිණ. කාලිෆ්වරයා එය ඉතා හොඳින් කියවා බැලීය. ඔහුට නගරය තුළ සිදුවන හැම දේ ගැනම හොඳින් දැන ගැනීමේ උවමනාවක් තිබිණ.

එදින රැයේ ඔහු තම අගමැති වරයා කැඳවීය.

''අපි දෙදෙනා අද රෑ සාමාන්‍ය ඇඳුම් ඇඳගෙන නගරයේ වීදිවල ගමන් කරමු. මට දැන ගන්න ඕනෑ අලි ගැන අනිත් මිනිසුන් කතාවෙන දේවල්. ඔහු මෝඩයෙක්ද ... සත්‍ය පවසන්නෙක්ද... එහෙම නැතිනම් හොරෙක්ද... කියලා ''

ඒ අනුව සාමාන්‍ය ඇඳුමින් සැරසුණු කාලිෆ්වරයා සහ අගමැති නගරයේ ඇවිදින අතර අලි පදිංචි වීදිය ඔස්සේ ඇවිද යන්නට වූහ. ඒ යන ඔවුනට ළමුන් පිරිසක් අලි සහ හුසේන්ගේ නම් කියනු ඇසිණි.

''ඔබ අලි වෙන්න..'' එක් ළමයෙක් කීය.

''මම හුසේන් වෙන්නම් .....'' තව ළමයෙක් පැවැසීය.

''හරි ... මම අධිකරණ නායකයා වෙන්නම්....'' තවත් ළමයෙක් එසේ කීය.

මේ කියමන් ඇසුණු කාලිෆ් සහ අගමැති මඳක්

නතරවී අවට විපරම් කළහ. ගසක් යට එක් රැස්වූ ළමුන් පිරිසක් යම් ක්‍රීඩාවක නිරතවන්නට සූදානම් වන අයුරු ඔවුනට පෙනිණ. ඔවුහු උනන්දුවෙන් ඒ දෙස බලා සිටින්නට වූහ.

ගස මුල සිටින එක් ළමයෙක් අධිකරණ නායකයාගේ වෙස් ගත්තේය. තවත් ළමයකු අලි වූ අතර තව ළමයෙකු හුසේන් සේ සැරසුණේය. ඔවුන් තිදෙනා වටේ අතින් ළමුන් රැස්වූහ. අනතුරුව ක්‍රීඩාව ඇරඹිණ. අධිකරණ නායකයාසේ පෙනී සිටි ළමයා ඉතා බුද්ධියෙන් ප්‍රශ්න කීපයක්ම ඇසීය. කාලිෆ් වරයා ඉතා උනන්දුවෙන් මේ සියල්ලම අසා හුන්නේය.

ක්‍රීඩාව නිමවී ළමුන් වෙනත් සෙල්ලමක් පටන් ගනිත්ම කාලිෆ් වරයා අගමැති ඇමතීය.

''ඔබ ගිහින් අර අධිකරණ නායකයා සේ සෙල්ලම් කළ ළමයාට හෙට උදේට මගෙ මාලිගයට එන්න කියන්න. ඒ සමඟම ඔබ අපේ අධිකරණ නායකයා, අලි කෝගියා, හුසේන් සහ නගරයේ සිටින ඔලිව් වෙළෙන්දන් දෙදෙනකුත් හෙට උදයේ මගේ මාලිගයට කැඳවන්නට ඕනෑ.''

පසුවදාට එළිය වැටිණ. කාලිෆ්වරයාගේ නියෝගය අනුව අගමැති විසින් යට කී සියලුම දෙනාම මාලිගය කරා කැඳවා ගෙන ආවේය.

ඒ පැමිණි අයගෙන් අධිකරණ නායකයා සිතුවේ තමා දුන් වැරදි තීන්දුවක් ගැන විමසන්නට කාලිෆ්වරයා තමාව කැඳවන්නට ඇතැයි කියාය. එනිසා ඔහු සිටියේ තැතිගැන්මෙනි. තමා හොරෙක් ලෙස කාලිෆ්වරයා සැක කරන්නේ යැයි යන තැතිගැන්ම අලිට විය. හුසේන් ද පසුවූයේ තැතිගැන්මෙනි. ඒ තමා සොරෙක් යැයි කාලිෆ්වරයා සැක කරන්නේය යන සිතුවිල්ල නිසාය.

තමන් කැඳවූයේ කුමටදැයි නොදන්නා වෙළඳුන්

දෙදෙනා ද තැතිගැන්මෙන් මුළු ගැන්වී සිටියේ ය. එහෙත් ළමයා පමණක් සිටියේ මවිතයෙනි. ඒ මෙවන් අලංකාර මාලිගයක සිරි විසිතුරු නැරඹීමට ලැබුණු නිසාය.

කාලිෆ්වරයා පිරිස සිටි ශාලාවට ඇතුළුව අසුන් ගත්තේය.

''එන්න දරුවා.... '' ඔහු ළමයාව තමා වෙත කැඳවීය.

අනතුරුව කාලිෆ්වරයා ඒ ළමයාව තමා අසලම අසුනක හිඳුවා ගත්තේය.

''දරුවා.., ඔබලා ඊයේ රාත්‍රියේ කළ සෙල්ලම මා බලා සිටියා. ඔලිව් ජෝගුවේ නඩු තීන්දුව ඔබ අපූරුවට සෙල්ලම් කළා. දැන් ඔබ එය ඇත්තටම කරන්න....''

ළමයාට එසේ කියූ කාලිෆ්වරයා තම අධිකරණ නායකයා දෙසට හැරුණේය.

''දැන් ඔබ මේ ළමයාට හොඳට ඇහුම්කන් දී අසත්‍යයෙන් සත්‍ය වෙන්කර ගන්නා හැටි බලන්න... කවුද වැරදි කියා කියන්න.... හොරු කවුද හොඳ මිනිසා කවුද කියලා කියන්න.''

සියල්ලෝම විමතියෙන් බලා සිටියහ. ළමයා චකිතයකින් තොරව පැහැදිලිව කතා කරන්නට විය.

''කෝ ජෝගුව මෙහාට ගේන්න..'' ළමයා කීය.

සේවකයකු ජෝගුව ගෙනැවිත් පිරිස හමුවේ තැබීය.

''මෙය ඔබ ඔබේ මිතුරාට දුන් ජෝගුවද?'' ළමයා ඇසීය.

''ඔව්.....'' අලී කීය.

''මෙය අලී විසින් ඔබට පරිස්සම් කර තබන්නට දුන් ජෝගුවද?''

''ඔව්....'' හුසේන් පිළිතුරු දුන්නේය.

ළමයා ජෝගුව තුළට අත දමා ඔලිව් ස්වල්පයක් ගත්තේය. ඔහු එයින් ස්වල්පය බැගින් කාලිෆ්වරයාටත්, අලීටත්, හුසේන්ටත් දී ඔහුද කටේ දමාගෙන සෙමින් හපන්නට විය.

''මේවා ඉතා හොඳ ඔලිව්....''

ඔලිව් ඇටය හපන ගමන් එසේ කී ළමයා හුසේන් දෙස බැලීය.

''ඔබ මේ ජෝගුවේ ඇති ඔලිව් ස්වල්පයක් හරි මීට පෙර කාලා තියෙනවාද?''

''එකක්වත් කාලා නැහැ.'' හුසේන් පැවසීය. ''අලී මෙය මගේ සාප්පුවේ තියලා ගිය දා පටන් ආපසු ඔහු ඇවිත් මෙය ගෙනියන තුරු මම මේ ජෝගුවට අතවත් තිබ්බේ නැහැ.''

අනතුරුව ළමයා කාලිෆ්වරයා විසින් කැඳවා තිබූ නගරයේ ඔලිව් විකුණන වෙළෙන්දන් දෙදෙනා දෙසට හැරුණේය.

''ඔබලා කාලා බලන්න.. අවුරුදු හතක් පරණ වුණත් මේවා තවමත් හොඳ ඔලිව් ද කියලා ඔබලා කාලා බලන්න.'' ළමයා වෙළෙන්දාට කීය.

''අවුරුදු හතක්..?'' ඔලිව් පරීක්ෂාකර බැලූ එක් වෙළෙන්දෙක් මවිතයෙන් මෙන් පැවසීය. ''මම බැලූ බැල්මට කියන්නම් මේ ඔලිව් ඒ තරම් පැරණි ඒවා නෙවෙයි කියලා.. මේවා මේ අවුරුද්දේ ඔලිව්..... අවුරුදු තුනකට වඩා ඔලිව් තියා ගන්න බැහැ.....''

''අවුරුදු දෙකකින් ඔලිව් වල පාට වෙනස් වෙනවා.. මේවා අලුත්ම අලුත් ඔලිව්....'' දෙවැනි වෙළෙන්දා කීවේ පළමු වෙළෙන්දාගේ මතය අනුමත කරමිනි.

''ඒත් හුසේන් කියනවා මේවා අවුරුදු හතක්

තිස්සේ ජෝගුවක් ඇතුළෙ තිබුණු ඔලිව් කියලා...?'' ළමයා වෙලෙන්දන් අමතා පැවසීය.

''මම අවුරුදු විස්සක් තිස්සේ ඔලිව් මිලදී ගෙන විකුණනවා.. ඒ අත්දැකීමෙන් මට නිශ්චිතවම කියන්නට පුළුවන් මේ ඔලිව් නම් කොහොමත් අවුරුදු හතක් පරණ නැහැයි කියලා.'' පළමු වෙළෙන්දා යළින් ස්ථිරවම තම මතය සනාථ කරමින් කීය.

මේ සියල්ලට ඇහුම්කන් දී සිටි හුසේන්ගේ මුහුණ සුදු මැලි විය. ඔහු ගේ දෙනෙත් බිමට නැඹුරුවිය.

''මම රන් කැබලි ටික ගත්තා...'' ඔහු පැටලිලි සහිතව කීය. ''ඒ සේරම මගෙ ගෙවත්තේ වලක වළලා තියෙනවා....''

''නුඹ දන්නවානෙ අපෙ රටේ නීතිය අනුව හොරුන්ට අයිතිවන දඬුවම.....?'' කාලිෆ්වරයා හුසේන්ගෙන් ඇසීය.

හුසේන්ට පෙර අලි පිළිතුරු දෙන්නට ඉදිරිපත් විය.

''උතුම් කාලිෆ් තුමනි, ඔහුගේ අත කපා දමන්න එපා.. එක කාලයක් ඔහු මගේ හොඳ මිතුරකුව සිටිය කෙනෙක්. ඔහු ළඟ රත්තරන් තබා යාමෙන් මමයි වරද කළේ.... ඒ නිසා ඔහුට දඬුවම් නොකර යන්නට හරින්න...'' අලි අයැද සිටියේය.

කාලිෆ්වරයා ඒ ගැන ළමායාගේ අදහස් විමසන්නට මෙන් ළමයා දෙස බැලීය.

''ප්‍රසිද්ධියේ මෙවන් දෙයක් හෙළිවීම ඔහුට හොඳ දඬුවමක්.. ඒ ඇති'' ළමයා කීය.

''එහෙනම් එසේ කරමු.... '' ළමයාගේ තීන්දුවට අනුමැතිය දුන් කාලිෆ් වරයා හුසේන්ව මුදා හැරියේය.

හුසේන්ට අත බේරා ගත හැකි වුවද ඔහුට තිබූ

කීර්ති නාමය අහිමි විය.

''නිවැරදි තීන්දුවක් වෙනස් කරන්නට රත්තරන් ජෝගු විස්සකටවත් බැහැ.'' බලවත් හෙරොන් කාලිෆ් වරයා ළමයා පසසමින් කීය.

''සත්‍ය සොයා ගැනීම හරිම අමාරුයි.''

05. අඟුටුමිට්ටා සහ මාළු කටුව.

එක්තරා නගරයක මාළු වෙළෙන්දෙක් සිටියේය. රළු මිනිසකු සේ පෙනුණ ද ඔහු මිතුරු ඇසුරට බෙහෙවින් ලොල් පුද්ගලයෙකි. රාත්‍රිය එළඹෙත්ම තම වෙළඳ සැල වසා දමන ඔහු ඉන්පසු කරනුයේ වීදි දිගේ ඇවිදමින් මිනිසුන් හා දොඩමළු වීමය. ඒ අතරින් යමෙකු තමාව සිනහ ගැන්වීමට සමත් වුවහොත් අනිවාර්යයෙන්ම ඒ පුද්ගලයා රාත්‍රි කෑම සඳහා තම නිවසට කැඳවාගෙන යාම මේ මාළු වෙළෙන්දාගේ සිරිත විය.

දිනක් රාත්‍රියේ මේ අන්දමින් වීදි දිගේ ඇවිද ගිය ඔහුට අපූරු මිනිසෙකු හමුවිය. උස මහත බෙහෙවින් අඩු අඟුටුමිට්ටෙකු වැනි වූ ඒ මිනිසා විවිධ රස කතා කියමින් මාළු වෙළෙන්දාව සතුටට පත් කළේය.

''එන්න මගෙ නිවසට යන්න......'' මාළු වෙළෙන්දා අඟුටුමිට්ටාට ඇරයුම් කළේය. ''අපේ ගෙදරට ඇවිත් තව රස කතා කියන්න.. මගෙ බිරිඳ ලොකු මාළුවෙක් උයලා ඇති. ඔබට පුළුවන් අපිත් එක්ක රාත්‍රි ආහාරය ගන්නත්...''

අඟුටුමිට්ටා එයට කැමතිවිය.

අඟුටුමිට්ටා තම නිවසට කැඳවාගෙන ගිය මාළු වෙළෙන්දා ඔහු සමඟ රෑ කෑමට සැරසිණි.

මාළු වෙළෙන්දාගේ බිරිඳ විශාල මාළුවෙකු රසට උයා තිබිණ. එහි සුවඳ අපූරුය. අඟුටුමිට්ටා සිටියේ ද තද බඩගින්නේය. ඒ නිසා ඔහු මහත් රුචියෙන් මාළු කන්නට විය. මාළු වෙළෙන්දාගෙ බිරිඳ ද ලෝබ නැතිව වැඩි වැඩියෙන් අඟුටුමිට්ටාට බෙදන්නට වූවාය.

''ඔබ බඩපිරෙන්නට කන්නෙ නැති නිසයි ඔය තරම් පුංචි...'' ඇය විහිළු කරමින් බෙදුවාය. ''ඔබ අපේ නිවසේ නතර වෙනවා නම් අපි ඔබට හොඳට කවලා දැවැන්ත මිනිසෙක් කරන්නම්.....''

අගුටුමිට්ටාගේ සිරුරේ හැටියට ඇය කී මෙම කීම අපූරු විහිළුවක් විය. එයට උස් හඬින් සිනාසෙන අතරම මාළු වෙළෙන්දා අගුටුමිට්ටා ගේ පිට හරහා පහරක් ගැසීය.

ඔහු මේ පහර ගැසුවේ සතුටට මෙන්ම මිත්‍ර කමටය. එහෙත් ඒ පහර නිසා ඇතිවූ ප්‍රතිඵලය නරක එකක්ම විය.

ඒ වේලාවේ අගුටුමිට්ටා සිටියේ මාළු සහිත ආහාර මිටක්ම මුව තුළට ඔබාගෙන ගිලින්නට සූදානම්වය. එහෙත් මාළු වෙළෙන්දාගෙන් අනපේක්ෂිතව වැදුණු පහරින් ඒ කෑම අහුර ඔහුගේ පිට උගුරෙහි ගියේය. වැරදීමකින් ආහාර අතරට එකතුවී තිබුණු ලොකු මාළු කටුවක් ඔහුගේ උගුරෙහි සිරවිය.

අගුටුමිට්ටාට කතා කරගත නොහැකි විය. ඔහු සිට ගත්තේය. ඔහුගේ මුව ඇරී දෙනෙත් විසල් විය. මුහුණ රත් පැහැ ගැන්වී අනතුරුව නිල් පැහැ ගැන්විණ. ඉනික්බිති අව්‍යක්ත සිහින් හඬක් නගමින් බිම ඇද වැටිණ.

වෙළෙන්දා බිය පත් විය. අගුටුමිට්ටා මිය යන්නට ඇතැයි ඔහුට සිතිණ.

''මගෙ ගේ අස්සේ මැරුණු මිනිහෙක් තියාගන්නට බැහැ.'' ඔහු කීය. මේක හරිම ප්‍රශ්නයක් වෙනවා. මාව අධිකරණයට ගෙනියාවි. ඔවුන් කියාවි මේ මරණයට මම වගකිව යුතුයි කියලා... ඊට පස්සේ මොකද වෙන්නෙ..?

''අපි මොහුව අපේ නිවසින් පිටතට ගිහිල්ලා

දමමු...'' බිරිඳ යෝජනා කළාය.

බිරිඳගේ අදහසට එකඟ වෙනවා හැරෙන්නට වැඩි දුර සිතීමේ හැකියාවක් වෙළෙන්දාට නොවීය. ඔහු අගුටුමිට්ටාගේ සිරුර ඔසවාගෙන තම නිවසින් පිටතට පැමිණියේය.

මාළු වෙළෙන්දාගේ නිවස ඉදිරියෙහි පාරෙහි අනෙක් පැත්තේ ඇති නිවසෙහි උඩුමහලෙහි සිටිනුයේ දොස්තරවරයෙකි. අගුටුමිට්ටාගේ සිරුර ඔසවා ගත් මාළු වෙළෙන්දා දොස්තරගේ නිවසට පහත සිට ඇති තරප්පුව නැග්ගේය.

අනතුරුව අගුටුමිට්ටාගේ සිරුර දොස්තරගේ දොර ළඟ තැබූ මාළු වෙළෙන්දා දොරට දෙතුන් වරක් තට්ටු කර ආපසු තම නිවස බලා දිව ආවේය.

මේ අවස්ථාවේ දොස්තරවරයා තම මිතුරකුගේ පැමිණීම අපේක්ෂාවෙන් ගෙතුළට වී සිටියේය. හිටි හැටියේම දොරට තට්ටු කරන හඬ ඇසුණු දොස්තරවරයා තම මිතුරා පැමිණ ඇතැයි සිතීය. ඔහු හුන් තැනින් නැගිට විත් දොර විවෘත කළේය. නමුත් ඔහු දුටුවේ තම මිතුරා නොව දොරකඩ පහළ වැටී සිටින අගුටුමිට්ටාය.

''මම මොකද කරන්නේ....''

එසේ තමාටම කියාගත් දොස්තර බිම වැටී සිටින අගුටුමිට්ටා වෙතට ආවේය.

අගුටුමිට්ටාගේ සෙලවීමක් නැත. ඔහු හුස්ම ඉහළ පහළ හෙළන ස්වරූපයක්වත් දොස්තරට නොපෙනිණ. දොස්තරගේ සිත කලබල විය. දොස්තරවරයකු වන තමා විසින් මිනිසෙකු මරා දමා ඇතැයි අනෙකුත් මිනිසුන් දැනගතහොත් තමා කරා රෝගීන් නොඑතැයි ඔහුට සිතිණ.

ඔහු මාර්ගයේ ඉහළ පහළ වෙත දෑස් යොමා

බැලීය. කිසිවකු පෙනෙන තෙක් මානයේ නැත. ඒ සමඟම දොස්තරට මතක්වුණේ තම නිවසට යාබද නිවසේ සිටින කුරුළු වෙළෙන්දාය ගෙවල් දෙක වෙන්වන්නේ තාප්පයකිනි.

''තාප්පයෙන් එහා පැත්තට මේ සිරුර දමලා කුරුළු වෙළෙන්දාව වරදට අසු කළ යුතුයි.'' දොස්තර තමාටම කියා ගත්තේය.

අගුටුමිට්ටා ගේ සිරුර එතරම් බරැති එකක් නොවීය දොස්තර කිසිදු අපහසුවකින් තොරව ඒ සිරුර ඔසවා තාප්පයෙන් එහාට දැමීය.

සිරුර වැටුණේ කුරුළු වෙළෙන්දාගේ නිවසෙහි ඇති කුරුළු කූඩුවක් මතටය. එයින් කූඩුවක් බිමට පෙරළිණි. කලබලයට පත් කුරුල්ලෝ කෑ ගසන්නට වූහ.

මහලු කුරුළු වෙළෙන්දාගේ කුරුළු කූඩු වලට කීප වතාවක්ම සොරුන්ගෙන් කරදර පැමිණ තිබිණ. එනිසාම මේ රැයේ ද කුරුල්ලන් කලබලයෙන් කෑ ගසන හඬ ඇසුණු ඔහු හොඳ පොල්ලක් ද අරගෙන නිවසින් පිටතට ආයේය. පෙරළී ඇති කුරුළු කූඩුවක් හා එහා පැත්තෙන් ඔහුට මිනිස් හිසක් පෙනිණ. ඔහු තම අත රැඳි පොල්ලෙන් වේගයෙන් පහරක් එල්ල කළේය.

''වරෙන් එළියට හොර තක්කඩියා... පෙන්නාපන් මට නුඹ හොරකම් කළ දේ....'' මහලු වෙළෙන්දා කෑගැසීය.

නමුදු සොරාගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොමැති කුරුළු වෙළෙන්දා සොරාව පිටතට ඇද්දේය.

''වරෙන් එළියට...... නුඹ මොනවාද මගේ කුරුළු කූඩුව අස්සේ කළේ.''

නමුදු අගුටුමිට්ටා කිසිවක් තෙපළුවේ නැත.

මහලු මිනිසා නොසන්සුන්තාවයකට පත්විය.

ඔහු අගුටුමිට්ටාගේ සිරුරට සමීප වී බැලීය. ඒ සිරුරෙහි කිසිදු ජීවයක් ඇති අයුරක් පෙනෙන්නට නොමැත.

''මම මොහුට පහර දුන්නා වේගවත් වැඩියි..'' මහලු වෙළෙන්දා සිතීය. ''මොහු හරිම කුඩා පුද්ගලයෙක්. හොරාට ගහපු එක වෙනම දෙයක්.... ඒත් මොහු මරා දැමීම තවත් එකක්.... අධිකරණය කුමන තීරණයක් දෙයිද?''

''ඔහු වට පිට බැලීය. පාරෙ තොටේ කිසිවකු නොමැත. සැණෙකින් සිරුර ඔසවා ගත් ඔහු වීදිය දිගේ මඳක් පහළට ගොස් විශාල ගෙයක් ළඟ නතර විය. ඒ ගෙයි දොරකඩ සිරුර තැබූ ඔහු එය නිදාගන්න ඉරියව්වකට සකස් කළේය. අනතුරුව වහාම තම නිවස වෙත දිව ආවේය.

මෙම විශාල නිවසෙහි අයිතිකරු ධනවත් පුද්ගලයෙකි. ඔහු තදින් කෝපවන අයෙකු නිසා එම වීදියේ අනෙක් අය මෙම පුද්ගලයා සමඟ ඇසුරක් නොපැවත්වූහ. මොහු නිවසේ සිටින අවස්ථාවල බිරිඳට, දරුවන්ට සහ මෙහෙකරුවන්ට නිතරම තද පරුෂ ලෙස බැණවදින බව අසල්වැසියෝ දැන සිටියහ.

මෙම රාත්‍රියේ දී ඔහු සිටියේ නිවසින් බැහැරව රාත්‍රී කෑමකට සහභාගී වෙමිනි. එහිදී ඔහු වැඩිපුර කෑවා පමණක් නොව මිතුරක් සමඟ ආරවුලක් ද ඇති කර ගත්තේය.

ඒ කේන්තිය පිට නිවසට ආ ඔහුට තම දොරකඩ නිදා සිටිනා මිනිසෙකු දක්නට ලැබිණ. ඔහු කෝපයෙන් කෑ ගැසීය.

''මේ පාරෙ වෙන ගෙවල් නැද්ද මිනිහෝ මගෙ දොරකඩම නිදාගන්නට ආවෙ...'' එසේ කියමින් ඔහු අගුටුමිට්ටාට පහරක් ගැසීය.

''නැගිටපන්...''

අගුටුමිට්ටා නැගිට්ටේ නැත නමුදු ඒ කෑ ගැසීම ඇසුණු අහල පහළ ගෙවල්වල අය අවදි වූහ. තම තමන්ගේ ජනෙල් වලින් එබී බැලූ ඔවුනට ධනවත් පුද්ගලයා අගුටුමිට්ටාට පා පහර දෙන අයුරු පෙනිණි.

එසේ බලා සිටි ඔවුන් නිවෙස් වලින් පිටවී පාරට අවතීර්ණ වී කෑ ගසන්නට වූහ.

''ඔබ ඔය කුඩා මිනිසා මරා දමන්නයි හදන්නේ....''

ඔවුනගේ කෑ ගැසීම නිසා ධනවත් මිනිසා පහරදීම නතර කළේය. අනතුරුව ඔහු අගුටුමිට්ටා වෙත එබී බැලීය. සියල්ලෝම නිහඬ වූහ.

''බලන්න...'' අගුටුමිට්ටා වෙත එබී බැලූ එක් මිනිසෙක් ධනවත් පුද්ගලයා ඇමතීය. ''මම කිව්වා ඔබට පයින් ගහන්න එපා කියලා. ඒත් ඔබ ගැහුවා. ඔහු මැරිලා... ඔබ ඔහු මරා දමලා...''

ඒ සමඟම ජනෙල් වලින් එබී බලා හුන් අයද ගෝෂා කරන්නට වූහ.

''ඔහු අර අහිංසකයා මැරුවා... ඔහු තමා මිනීමරුවා... ඔහුව අධිකරණයට ගෙන යමු...'' සියල්ලෝම එක්වම හඬ නගන්නට පටන් ගත්හ.

ඒ වෙලාවේ තවමත් රාත්‍රිය පැවති හෙයින් අධිකරණ නායකයාගේ නිවසට යාමට මිනිසුන් කතිකා කර ගත්හ. ඔවුහු අගුටුමිට්ටාගේ සිරුරත් ඔසවාගෙන අධිකරණ නායකයාගේ නිවසට ගියහ.

අධිකරණ නායකයා අවදිව මිනිසුන් හමුවට ආවේය. ඔහු අගුටුමිට්ටාගේ සිරුර පරීක්ෂා කර බැලීය. අනතුරුව ඔහු මිනිසුන් කියන දෙයට කන්දුන්නේය. ඉන්පසු ඔහු ධනවත් මිනිසා අමතා ඔහු කළ දේ විමසීය. තමා අගුටුමිට්ටාට පයින් පහර දුන් බව ඔහු පිළිගත්තේය.

''එයම ඇති මේ කුඩා මිනිසාගේ මරණය සිදුවන්නට....'' අධිකරණ නායකයා පැවසීය. ''ඒ අනුව ඔබටත් මරණ දඬුවම හිමිවෙනවා.''

මේ තීන්දුව අසා ආපසු යන මිනිසුන් කීප දෙනෙකුව වයසක කුරුළු වෙළෙන්දා මුණ ගැසිණ. සිද්ධිය විස්තර කල ඔවුහු ධනවත් පුද්ගලයාට මරණ දණ්ඩනය නියම වූ බවද පැවසූහ.

කුරුළු වෙළෙන්දා කම්පාවට පත්විය. ''මා කළ දේ නිසා නිරපරාදේ ඒ මිනිහව මරා දැමුවොත් දෙවියන් වහන්සේ මට දඬුවම් කරාවි... මම ඇත්තම කියනවා..''

එසේ සිතූ ඔහු අධිකරණ නායකයා වෙත ගියේය.

''මේ මිනිසා නෙවෙයි අගුටුමිට්ටා මැරුවේ..... ඔහු පා පහර දෙද්දීත් මේ අගුටුමිට්ටා මැරිලයි හිටියේ.'' ඔහු පවසන්නට විය. ''මේ අගුටුමිට්ටා මගෙ කුරුළු කොටුව හොරකම් කරන්නට ආවා. මම මේ හෙල්ලෙන් ඔහුට ගැහුවා. එවිට ඔහු මැරුණා. ඉන්පස්සේ මම මේ සිරුර මේ ධනවත් මිනිසාගේ දොරකඩට ගෙනැවිත් දැම්මා.''

එවිට ඔහු කළ දේ නැවත කර පෙන්වන්න යැයි අධිකරණ නායකයා කීය. එවිට කුරුළු වෙළෙන්දා අගුටුමිට්ටා අසලට ගොස් තම අත රැදි හෙල්ලෙන් ඔහුගේ හිසට පහරක් ගැසීය.

''හරි ඔබ තමා ඔහු මරලා තියෙන්නේ.. එසේ නම් මරණ දඬුවම හිමිවිය යුත්තේ ඔබටයි...'' අධිකරණ නායකයා පැවසීය.

මෙම තීන්දුව දොස්තරවරයාට ආරංචි විය. ඔහු වහාම අධිකරණ නායකයා වෙත ගියේය.

''ඉක්මනින් තීන්දු ගන්න එපා. අගුටුමිට්ටා මැරුවේ කුරුළු වෙළෙන්දා නෙවෙයි මමයි. '' දොස්තර කීය. ''අගටුමිට්ටා දොරකඩ සිටියා. මම දොර ඇරිය

ගමන් ඔහුව පඩිපෙළ දිගේ පහතට තල්ලු කළා. මෙන්න මෙහෙම.....''

එසේ කියමින් දොස්තර වරයා තම පයින් අගුටුමිට්ටාව බිම දිගේ පෙරළා දැමීය.

''ඉන් පස්සෙ මම අගුටුමිට්ටාගේ සිරුර මගෙ තාප්පයෙන් එහා පැත්තෙ තියෙන මේ කුරුළු වෙළෙන්දාගේ නිවසට විසිකළා...''

''අපි දැන් මෙහි අවසානයක් දැකිය යුතුයි.....'' අධිකරණ නායකයා රැස්ව සිටින සියල්ලන්ම අමතමින් කීය.

''එසේ නම් ඔබමයි මේ අගුටුමිට්ටා මරලා තියෙන්නේ''

අධිකරණ නායකයා දොස්තර අමතමින් එසේ කියත්ම සෙනඟ පීරාගෙන මාළු වෙළෙන්දා ඉදිරියට ආවේය.

''එහෙම නෙවෙයි මේ මරණය සිද්ධවුණේ.....'' මාළු වෙළෙන්දා කීය. ''මේ කවුරුවත් නෙවෙයි අගුටුමිට්ටා මැරුවේ මමයි.....''

එසේ කී ඔහු තම නිවසේදී සිදුවූ සියල්ල විස්තර කළේය.

''ඔබ ඔහුට ගැසුවේ කොහොමද කියලා අපට නැවත කරලා පෙන්වන්න.'' අධිකරණ නායකයා කීය.

මාළු වෙළෙන්දා අගුටුමිට්ටාව ඔසවා ඔහුගේ පිටට වේගවත් පහරක් ගැසීය.

ඔහුගේ ඒ පහරත් සමඟම මෙතෙක් වෙලා අගුටුමිට්ටාගේ උගුරේ හිරවී තිබූ මාළු කටුව පිටතට විසිවිය.

අගුටුමිට්ටා හුස්ම ඉහළ පහළ හෙළමින් දෙනෙත් විවර කළේය. ඔහු මැරී නොසිටියේය.

''ආ..හ්..... ආ...හ්.....'' ඇඟපතේ හිරි ඇර ගනිමින් අගුටුමිට්ටා වටපිට බැලීය. ''මම මේ කොහෙද ඉන්නේ...?''

අධිකරණ නායකයා පිරිසට සංසුන්වනසේ අණ කළේය.

''දැන් අගුටුමිට්ටා මිය ගොස් නැහැ. ඒ නිසා කිසිම කෙනෙකුට මරණ දඬුවම හිමිවන්නේ නැහැ. ඒත් ඔබලා මොහුට කළ දේවල් වෙනුවෙන් එක්කෙනා රත්තරන් ඩිනාර් පණහ බැගින් මොහුට ගෙවන්නට ඕන. ඒ වගේම තව දෙයක් ඔබලා එකිනෙකා අනෙකාට මෙහෙම කළේ ඇයි කියලා මට හිතාගන්න බැහැ. ඒත් මම එක් දෙයක් තීරණය කළා. මේ වගේ මිනිසුන් ඉන්න තැනක රත්තරන් ඩිනාර් පන්දාහක් දෙන්නම් කිව්වත් මං නම් ඉන්නේ නැහැ.''

අධිකරණ නායකයා තීන්දුව ප්‍රකාශයට පත්කර කතාව නිම කළේය.

එය ඒ අන්දමින් සිදු විය.

ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව උසස් තත්ත්වයෙන් වටිනා පොත් සහන මිලට.

සුසර ප්‍රකාශකයෝ®

www.susarapublications.net

ISBN - 978-955-676-685-1

9 789556 766851

SchoolMATE
EXERCISE BOOKS & STATIONERS

BOB56
Rs. 60.00

Printed & Compiled by: Susara Printers, No: 429/120, Gonahena, Kadawatha.

www.facebook.com/susarapublications

LG.180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
Tele : 0112 430721 Fax : 0112 334597
E-mail : susarapub@gmail.com